අධ්‍යාපන අමාත්‍යාංශය

# විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය

නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 Fax +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/18/4/5/9 - I

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022.09. 08

**චක්‍රලේඛ අංක:- 33/2022**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත්/කලාප විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත්/කලාප ප්‍රාථමික අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්/ගුරු විදුහල්වල විදුහල්පතිවරුන්,
සියලු ම රජයේ විදුහල්වල විදුහල්පතිවරුන්, විශේෂ/ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන්,
සියලු ම රජයේ අනුමත පෞද්ගලික විදුහල්වල හා උපකෘත විශේෂ විදුහල්වල විදුහල්පතිවරුන් වෙත,

<u>**විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය**</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවක දී ම සර්ව සාධාරණ මෙන් ම සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමට ඇති අයිතිය සහතික කර ඇත.

මානව සුභසිද්ධිය, සෞභාග්‍ය, පරිසරය හා සමස්ත ලෝකයේ සම්පත් අනාගත පරම්පරාවට ද ප්‍රයෝජනයට ගත හැකි පරිදි සුරක්ෂිත කරන ආකාරයේ වැඩපිළිවෙළක් හා සාමයෙන් හා සාධාරණත්වයෙන් පිරුණු ලෝකයක් බිහිකරලීම සඳහා ලඟා කරගත යුතු තිරසර සංවර්ධන අරමුණු 17ක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කර ඇත. තිරසර සංවර්ධන හතරවන සහශ්‍ර ඉලක්කයේ උප අරමුණක් වන්නේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් සඳහා අන්තර්කරණය සහිත ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම ය.

විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා 1969 දී ඒකීයකරණ අධ්‍යාපනය හඳුන්වා දීම සමඟ 70 දශකයේ මුල් භාගයේ දී ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මට්ටමින් අධ්‍යාපන තක්සේරු කමිටු පිහිටුවන ලදී. 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයත් සමඟ මධ්‍යම ආණ්ඩුවේ බලතල පළාත් සභාවලට බෙදා හැර ඇති අතර ළමයින්ට වඩාත් සමීප කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටු පිහිටුවීම කර ඇත. එමඟින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින් හඳුනා ගැනීමත්, ඔවුන් තක්සේරුකරණයටත්, ආසන්න පාසල්වලට ඇතුළු කිරීමටත් අවශ්‍ය පහසුකම් සැලසීමත් සිදු කරනු ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව වෙතින් විශේෂ අධ්‍යාපන වෘත්තිකයින්ගේ සහභාගිත්වයෙන් මෙම "විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ උපදෙස් සංග්‍රහය" සකස් කර ඇත.

මෙම තක්සේරුකරණය පිළිබඳ උපදෙස් සංග්‍රහය භාවිත කර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් තක්සේරුකරණය කිරීමත් මගේ 2020.12.03 දිනැති හා අංක 37/2020 සහිත විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිළිබඳ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය අනුව ඔවුන්ට අධ්‍යාපන අවස්ථා සැලසීමටත් ළමයින්ව උපරිම ලෙස සංවර්ධනය කර සාමාන්‍ය පාසල්වල සාමාන්‍ය පන්තිකාමරවල සමවයස් ළමයින් සමඟ අන්තර්කරණ අධ්‍යාපනයක් ලබාදීම සඳහා සුදුසු කටයුතු කරන ලෙසටත් මෙම උපදෙස් සංග්‍රහයෙන් දැනුම් දෙමි.

**එම්.එන්.රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත් :-**

1. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
3. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
5. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය
6. සියලු ම විෂය අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் +94112784832 Fax +94112784825
ලේකම් / செயலாளர் +94112784811 Fax +94112785162

## පටුන


පිටුව

1.0 හැඳින්වීම .................................................................................................... 1

2.0 දුබලතා සහිත මුල් ළමාවියේ ළමයින් ලියාපදිංචි කිරීම සහ වර්ගීකරණය ........................ 2

2.1 විශේෂ අධ්‍යාපන තක්සේරුව කවුරුන් සඳහා ද? ...................................................... 2

2.2 දුබලතා සහිත සහිත මුල් ළමාවියේ ළමයින් කලාප අධ්‍යාපන කාර්යාලයේ ලියාපදිංචි කිරීම ....................................................................................................... 2

2.2.1 දුබලතා සහිත මුල් ළමාවියේ ළමයින් ලියාපදිංචි කිරීම පිළිබඳ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යය මඟින් දෙමව්පියන්/භාරකරුවන් දැනුවත් කිරීම .................... 2

2.3 දුබලතා සහිත ළමයින් වර්ගීකරණය ................................................................... 2

3.0 දුබලතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන තක්සේරුකරණය ............................................ 3

3.1 තක්සේරුකරණය සිදුකරන ආයතන .................................................................... 3

3.2 කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව - Zonal Assessment Committee for the Special Education (ZACSE)................................................................. 3

3.3 කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ සාමාජිකයින්............................... 4

3.4 පුහුණුව ලැබූ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ කමිටු සාමාජිකයින්ට බලපත්‍ර ලබාදීම........................................................................................................ 4

4.0 දුබලතා සහිත ළමයින්ගේ දෙමව්පියන්/භාරකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ ......... 4

4.1 පළමුවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය ............................................................ 5

4.2 දෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය ............................................................... 5

4.3 තෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය................................................................. 6

4.4 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයට දුබලතා සහිත ළමයින් යොමු කිරීම .............. 7

5.0 විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදුකිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු ......................... 7

5.1 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ දිනය සහ වේලාව ............................................ 7

5.2 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයට සුදුසු ස්ථාන හා අනුගමනය කළ යුතු කරුණු .. 7

6.0 විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ ප්‍රධාන වගකීම .................................................... 10

6.1 විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශ ..................................................... 11

7.0 නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය ................................ 13

7.1 මෙම උපදෙස් සංග්‍රහයෙහි 6.1.1 සහ 6.1.2 නිර්දේශ ලබා ඇති උග්‍ර ආබාධිත ශිෂ්‍යයින් නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය ........................ 13

7.2 මෙම උපදෙස් සංග්‍රහයෙහි 6.1.3 සහ 6.1.4 නිර්දේශ ලබා ඇති ශිෂ්‍යයින් නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය ........................................... 14

8.0 වර්ධනීය ශිෂ්‍ය වාර්තා වාර්තා පොත (Augmantative Student Record Book - ASRB) . 14

9.0 පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (Individual Education Plan - IEP) ............................ 15

9.1වේලාසනින් මැදිහත්වීම සහ පුද්ගලබද්ධ පවුලේ සේවා සැලසුම (Individual Family Service Plan (IFSP)) ........................................................................... 15

9.2 සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයෙකුගෙන් (Mobile/Field Teacher) ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සඳහා පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (Individualized Education Plan/Program - IEP) ............................................................................. 16

පිටුව


9.3 උපකෘත විශේෂ පාසලේ/රජයේ විශේෂ පාසලේ/විශේෂ අධ්‍යාපන ඒකකයේ ගුරුභවතාගෙන් ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සඳහා පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (Individual Education Plan - IEP) .................................................................. 18

10.0 IEP කමිටු රැස්වීම.................................................................................................. 19

10.1 IEP කමිටුව රැස්විය යුතු අවස්ථා .......................................................................... 19

10.2 IEP සැලැස්ම සැකසීම ........................................................................................... 20

10.3 IEP සැලැස්මක් සකස් කිරීමේ දී අඩංගු විය යුතු කරුණු ........................................ 21

10.4 IEP සැලැස්මෙහි දිගු කාලීන ඉලක්ක .................................................................. 21

10.5 හැසිරීම සඳහා මැදිහත්වීමේ සැලසුම් (Behaviarol Intervention Plan - BIP) ........ 22

11.0 ශිෂ්‍යයාගේ විවිධත්වයට ගරුකරමින් සහ ආමන්ත්‍රණය කරමින් IEP කමිටුවේ එකඟතාවය මත ප්‍රාථමික අධ්‍යාපනයේ පළමුවන, දෙවන සහ තෙවන අදියර ක්‍රියාත්මක කිරීම ........................................................................................................................ 22

12.0 අන්තර්කරණ අධ්‍යාපනය ........................................................................................ 23

12.1 හය ශ්‍රේණියේ දී පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනය ................................................ 23

12.2 හය ශ්‍රේණියේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ........................................... 24

12.3 අ.පො.ස. (උසස් පෙළ) / තෘතියික අධ්‍යාපනය / උසස් අධ්‍යාපනය ........................ 24

13.0 පුද්ගලබද්ධ පාඩම් සැලසුම (Individual Lesson Plan - ILP) සහ බහුතල පාඩම් සැලසුම (Multi-Level Lesson Plan-MLLP) ......................................................... 24

13.1 පුද්ගලබද්ධ පාඩම් සැලසුම (Individual Lesson Plan - ILP) .............................. 25

13.2 බහුතල පාඩම් සැලසුම (Multi-Level Lesson Plan-MLLP) ............................... 25

14.0 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයා වෙනුවෙන් ඉගෙනුම් ඉගැන්වීම් සහ සම්භවන සහ සමපිණ්ඩිත ඇගයීම් ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි අනුවර්තන ක්‍රම .................... 25

15.0 පන්ති කාමර අනුවර්තන ............................................................................................ 27

16.0 කලාප මට්ටමේ විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශය මත දුබලතාවය පදනම් කරගෙන සාමාන්‍ය පාසලක පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කර අන්තර්කරණ අධ්‍යාපන පහසුකම් ලබා දීම ............................................................................. 28

16.1 ජාතික පාසල්වල පළමුවෙනි ශ්‍රේණියට දුබලතාවය පදනම් කරගෙන 3%ක් ඇතුළත් කිරීම ........................................................................................... 28

16.2 පළාත් පාසල්වල පළමුවෙනි ශ්‍රේණියට දුබලතාවය පදනම් කරගෙන 3%ක් ඇතුළත් කිරීම ........................................................................................... 28

16.3 දුබලතාවය පදනම් කරගෙන පළමුවෙනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම ......... 28

16.4 විශේෂ අධ්‍යාපන ඒකකයේ ශිෂ්‍යයින් ඒකීයකරණය කිරීමේ දී පන්තිවල ශිෂ්‍ය සීමා... 28

17.0 පාසල් මට්ටමේ සහ ජාතික මට්ටමේ විභාග පහසුකම් ලබා දීම/සම්භවන සහ සම්පිණ්ඩිත ඇගයීම් සිදු කිරීම ..................................................................... 29

18.0 පාසල් නවීකරණය සහ අනුවර්තනය .......................................................................... 30

19.0 පොදු උපදෙස් ................................. .............................................................. 31

පිටුව

**උපලේඛන අංක 01 -** බලය පැවරීමේ සහතිකය ................................................................ 32

**උපලේඛන අංක 02 -** සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FHB/CDU/GEN/0102021 හා 2021.10.28 දිනැති ලිපියේ සිංහල පරිවර්තනය ........................................................... 33

**උපලේඛන අංක 03 -** විශේෂ අවශ්‍යතා සහිත ළමයින් වර්ගීකරණය .................................. 35

**උපලේඛන අංක 04 -** විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් සඳහා පොදු තක්සේරු වාර්තාව .............................................................................................................. 37

**උපලේඛන අංක 05 -** ඔටිසම් තත්ත්වය සහිත ළමයින් සඳහා තක්සේරු වාර්තාව ................ 45

**උපලේඛන අංක 06 -** ශ්‍රවණ ඌනතා සහිත ළමයින් සඳහා තක්සේරු වාර්තාව ..................... 48

**උපලේඛන අංක 07 -** දෘෂ්ටි ඌනතා සහිත ළමයින් සඳහා තක්සේරු වාර්තාව ...................... 51

**උපලේඛන අංක 08 -** ඌන අවධානය සහිත අධි ක්‍රියාකාරී ළමයින් සඳහා තක්සේරු වාර්තාව 54

**උපලේඛන අංක 09 -** සුවිශේෂී ඉගෙනුම් දුබලතා සහිත ළමයින් සඳහා තක්සේරු වාර්තාව .... 56

**උපලේඛන අංක 10 -** තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව - 01 ................. 63

**උපලේඛන අංක 11 -** තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව - 02 ................. 72

**උපලේඛන අංක 12 -** වක්‍රලේඛයේ සියලු කරුණු ඇතුළත් ආදර්ශ පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම/වැඩසටහන (Individual Education Plan/Program - IEP) ................................... 86

**උපලේඛන අංක 13 -** ඒ ඒ සමෝධානිත විෂය සඳහා වෙන වෙන ම පවත්වා ගත යුතු ආදර්ශ පාඩම් සැලසුම (LP) .................................................................................................. 91

**උපලේඛන අංක 14 -** ආදර්ශ පුද්ගලබද්ධ පවුලේ සේවා ඉගෙනුම් සැලසුම (Individual Family Service Plan - IFSP) ......................................................................................... 93

**උපලේඛන අංක 15 -** සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FHB/CDU/GEN/0102021 හා 2021.10.28 දිනැති ලිපිය ........................................................................................ 97

## විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (දුබලතා) සහිත ළමයින්ගේ අධ්‍යාපන තක්සේරුකරණය සඳහා උපදෙස් සංග්‍රහය

### 1.0 හැඳින්වීම

සැමට අන්තර්කරණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි හතරවෙනි ඉලක්කයයි. දකුණු කොරියාවේ ඉන්චියොන් නගරයේ පැවැති (2015 වර්ෂය) යුනෙස්කෝ සමුළුව නිකුත් කළ ඉන්චියොන් ප්‍රකාශනයෙන් ද මෙය තහවුරු කර ඇත.

ශ්‍රී ලාංකීය ළමා පරපුරේ අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත් කිසිදු දිනයක පාසලකට නොගිය ළමයින් සිටින බව නිරීක්ෂණය වේ. එසේ පාසල් නොයන ළමයින් අතරින්, දුබලතා සහිත ළමයින් සහ විවිධ අවාසි සහගත පරිසරවල ජීවත්වන ළමයින් බහුතරය සිටින බව හඳුනාගෙන ඇත. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙහි "ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය (2016)" වාර්තාවට අනුව 2016 ජුනි 30 දින වන විට ආබාධිතභාවය නිසා පාසල්වලට ඇතුළත් නොවූ ළමයින් සංඛ්‍යාව 19,213ක් ලෙස දක්වා ඇත.

වර්ෂ 1994 ජුනි 7-10 ස්පාඤ්ඤයේ සලමන්කා නගරයේ පැවති යුනෙස්කෝ සමුළුවේ දී නිකුත් කළ සලමන්කා ප්‍රකාශය සහ ක්‍රියාත්මක සැලැස්ම තුළින් ජාති, ආගම්, කුල, වර්ණ, භාෂා, දුබලතාවය ආදි භේදයන්ගෙන් තොර ව සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සමවයස් ළමයින් සමඟ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති අතර එයට ශ්‍රී ලංකා රජයේ ද එකඟතාවය ලබා දී ඇත.

එසේ ම 2016.04.20 දිනැති සහ අංක 1963/30 දරණ අනිවාර්ය අධ්‍යාපන නියෝග ඇතුළත් අති විශේෂ ගැසට් පත්‍රය මඟින් දක්වා ඇති අනිවාර්ය අධ්‍යාපන නියෝග අනුව වයස අවුරුදු 05 සිට අවුරුදු 16 දක්වා සැමට අධ්‍යාපන අවස්ථා ලබාදීම අනිවාර්ය වේ.

කෙන්මෝර් වාර්තාවේ නිර්දේශ මත විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ දී උපාධිධාරීන් 28 දෙනෙකු සඳහා වසර දෙකක විශේෂ අධ්‍යාපන පාඨමාලාවක් පැවැත්වීමත්, රජයේ පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක ආරම්භ කර එම පුහුණු උපාධිධාරීන් ඒවායේ ඉගැන්වීමට යෙදවීමත් සමඟ ම 1969 වර්ෂයේ සිට ඒකීයකරණ අධ්‍යාපනය ආරම්භ කරන ලදී. මහාචාර්ය ඩී.අරම්පත්ත මහතාගේ විශේෂ අධ්‍යාපනය පිළිබඳ වාර්තාවේ නිර්දේශ පරිදි 1971 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපන ශාඛාව ආරම්භ කරන ලදී. ඉන් පසුව 70 දශකයේ දී ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මට්ටමෙන් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් පිළිබඳ අධ්‍යාපන තක්සේරුව කිරීම සඳහා තක්සේරු කමිටු පිහිටුවන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති සහ අංක 37/2020 දරණ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා තීරණය කිරීම සඳහා සෑම ළමයෙකු ම අධ්‍යාපන තක්සේරුකරණයට ලක්වීම අනිවාර්යය වේ. ඒ අනුව දුබලතා සහිත ළමයින් මෙන් ම ඉහළ බුද්ධිඵලයක් සහිත (සුහග) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය සඳහා කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමේ විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටු පිහිටුවීමට කටයුතු යොදා ඇත. විධිමත් අධ්‍යාපන තක්සේරු ක්‍රමවේදයක් සහිත ව ළමයින් හඳුනා ගැනීමටත්, පාසල්වලට ඇතුළත් කිරීමටත්, පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් සහිත ව ඔවුන් සංවර්ධනයට අවශ්‍ය පියවර ගැනීමටත් විශේෂ අධ්‍යාපන තක්සේරු ක්‍රමවේද හඳුන්වා දීම පිණිස 2022.09.08 දිනැති සහ අංක 33/2022 දරණ මෙම චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය නිකුත් කරනු ලැබේ.

මෙම උපදෙස් සංග්‍රහයේ ඇති උපදෙස් අනුව තක්සේරු ක්‍රියාවලිය නිවැරදිව සිදුකර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට මින් ඉදිරියට කටයුතු කළ යුතු ය.

## 2.0 දුබලතා සහිත මුල් ළමාවියේ ළමයින් ලියාපදිංචි කිරීම සහ වර්ගීකරණය

### 2.1 විශේෂ අධ්‍යාපන තක්සේරුව කවුරුන් සඳහා ද?

සෑම වසරක ම ජනවාරි 31 දිනට වයස අවුරුදු 03 සම්පූර්ණ කළ දුබලතා සහිත ශිෂ්‍යයින් සහ දෙමව්පියන් විසින්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් විසින් සහ නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් විසින් හඳුනාගෙන යොමුකරන ළමයින් ඇතුළු ව අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින සියලු ම දුබලතා සහිත ළමයින් (Children with Disability) සඳහා මෙම විශේෂ අධ්‍යාපන තක්සේරු ක්‍රම භාවිත කළ යුතු ය.

### 2.2 දුබලතා සහිත මුල් ළමාවියේ ළමයින් කලාප අධ්‍යාපන කාර්යාලයේ ලියාපදිංචි කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති සහ අංක 37/2020 දරණ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයට  අනුව අදාළ කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ කමිටු බල ප්‍රදේශයට අයත් දුබලතා සහිත වයස අවුරුදු 03 සම්පූර්ණ සියලු ම ළමයින් (Children with Disability) සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් තොරතුරු ලබා ගෙන කලාප අධ්‍යාපන කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු ය. (උප ලේඛන අංක 02 සහ 14) අනතුරුව කලාප අධ්‍යාපන කාර්යාලය විසින් අදාළ දෙමව්පියන් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, වයස අවුරුදු 04 සම්පූර්ණ වීමට ප්‍රථම ළමයා තක්සේරු කිරීම, වයස අවුරුදු 04 සම්පූර්ණ වන විට නිර්දේශිත ළමයින් අදාළ අධ්‍යාපන අවස්ථා සැලසීමට එම තොරතුරු භාවිත කළ යුතු ය.

#### 2.2.1 දුබලතා සහිත මුල් ළමාවියේ ළමයින් ලියාපදිංචි කිරීම පිළිබඳ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යය මඟින් දෙමව්පියන්/භාරකරුවන් දැනුවත් කිරීම

මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මඟින් තොරතුරු ලැබුණ ද, නොලැබුණ ද අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති සහ අංක 37/2020 දරණ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ 25.1 වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 03 සහ ඊට වැඩි, දුබලතා සහිත ළමයින් (Children with Disability) ලියාපදිංචි කරන ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දිය යුතු ය. එ මඟින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ දෙමව්පියන්/භාරකරුවන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන කාර්යාලයේ විශේෂ අධ්‍යාපන විෂයභාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැමිණ තම දරුවන් ලියාපදිංචි කළ යුතු ය.

### 2.3 දුබලතා සහිත ළමයින් වර්ගීකරණය

මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙතින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ තොරතුරු කලාප අධ්‍යාපන කාර්යාලවලට ලබා දීමේ දී සෞඛ්‍ය අංශ කටයුතු කරනුයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021.10.28 දිනැති හා අංක FHB/CDU/GEN/01/2021 දරණ ලිපියට අනුව ය. එම වර්ගීකරණයට අනුව දුබලතා සහිත ළමයින් වර්ග 19කි. (උපලේඛන අංක 02 සහ 15) ඇතැම් රටවල් ආබාධ සහිත ළමයින් සඳහා අධ්‍යාපනය ලබාදීමේ දී සිදුකරනු ලබන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ කොංග්‍රස් සභාව විසින් නැවත බලගන්වන ලද 2004 දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනතට (Individuals with Disabilities Education Act) අනුව සකස් කරන ලද වර්ගීකරණය මත ය.

අධ්‍යාපන අවස්ථා සැලසීමේ දී පොදු සාධක සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දුබලතා සහිත ළමයින් කාණ්ඩ 14කට වර්ග කර ඇත. එනම්,

1. ඔටිසම් රේඛීය පරාසය/ඔටිසම් ප්‍රේක්ෂක වර්ණාවලිය - Autism Spectrum Disorder (ASD)
2. සමස්ත සංවර්ධන ප්‍රමාදය - Global Development Delay
3. බුද්ධිමය දුබලතා - Intellectual disability
4. මොළයට සිදු වූ හානි - Brain Injury

5. පූර්ණ බිහිරි - Deafness හෝ ශ්‍රවණ ඌනතා - Hearing impairment
6. පූර්ණ අන්ධ - Blindness හෝ දෘෂ්ටි ඌනතා - Visual impairment
7. බහුවිධ දුබලතා - Multiple disabilities
8. ඩවුන්ගේ සහලක්ෂණය (ඩවුන් සින්ඩ්‍රෝමය - Down Syndrome) සහ ළමා රෝග විශේෂඥයන් විසින් නිර්දේශ වූ වෙනත් සහලක්ෂණයන් (සින්ඩ්‍රෝමයන්)
9. කායික ඌනතා - Orthopedic impairment
10. සුවිශේෂී ඉගෙනුම් දුබලතා - Specific Learning Disability (SLD)
11. චිත්තවේගී කැළඹීම - Emotional Disturbance
12. අඳ-බිහිරි - Deaf-blindness
13. භාෂණ හෝ භාෂා දෝෂ - Speech or language disorder
14. වෙනත් සෞඛ්‍ය ඌනතා - Other Health Impairment
    උදා:- ඌන අවධානය සහිත අධි ක්‍රියාකාරී බව - Attention Deficit Hyperactivity Disorder (ADHD)

සෞඛ්‍ය අංශ මඟින් සඳහන් කරන වර්ගීකරණය මෙම වර්ගීකරණයට ගොනුකර ගැනීම සඳහා මෙම උපදෙස් සංග්‍රහයේ උපලේඛන අංක 03 භාවිත කළ හැකි ය. වෛද්‍යවරුන් විසින් හඳුනාගෙන ඉදිරිපත් කරන වෙනත් සින්ඩ්‍රෝම හා වෙනත් තත්ත්ව සඳහා ද මෙම මැදිහත් වීම සිදු කළ යුතු ය.

### 3.0 දුබලතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන තක්සේරුකරණය

දුබලතා සහිත ළමයින්ගේ (Children with Disability) විශේෂ අධ්‍යාපන අවශ්‍යතාව නිවැරදිව හඳුනාගනිමින් ඔවුන්ට වඩාත් යෝග්‍ය ඉගෙනුම් අවස්ථා සම්පාදනය වෙනුවෙන් අධ්‍යාපන තක්සේරුවක් සිදුකිරීම සඳහා පහත සඳහන් වෘත්තිකයන්ගෙන් යුක්ත කමිටුව "කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව" ලෙස හැඳින්වේ. එම කමිටුව විසින් ළමයින් තුළ පුද්ගලබද්ධ ලෙස දක්නට ලැබෙන සුවිශේෂී වූ අවශ්‍යතා අනුව අඛණ්ඩවූත්, පුද්ගලාභිමුඛවූත් සහය ලබා දීම අවශ්‍ය වේ. ඒ සඳහා මෙහි 3.1 හා 3.2හි වගන්තිවල සඳහන් ආයතන ක්‍රියාත්මක වේ.

### 3.1 තක්සේරුකරණය සිදුකරන ආයතන

ළමයින්ගේ සංවර්ධන කටයුතු සඳහා පහත දැක්වෙන ආයතන 06 විසින් විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සිදුකරනු ලැබේ. එම තක්සේරු කමිටුවලින් විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදු කළ යුත්තේ මෙම 33/2022 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයට අනුව ය.

1. කලාපයීය අධ්‍යාපන තක්සේරුකරණ මධ්‍යස්ථාන
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
3. "ශිෂෝද්‍යා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය, වෙනිවැල්කොළ
4. ඕටිසම් ළමා සංවර්ධන මධ්‍යස්ථානය, මහරගම
5. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මඟින් පිහිටුවා ඇති තක්සේරු කරන මධ්‍යස්ථාන
6. පළාත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන

### 3.2 කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව - Zonal Assessment Committee for the Special Education (ZACSE)

දුබලතා සහිත ළමයින් තක්සේරු කිරීම සඳහා ඔවුන්ට වඩාත් පහසුවෙන් ළඟාවිය හැකි සහ ආසන්න ප්‍රදේශයක ස්ථාන ගත කිරීමට සෑම අධ්‍යාපන කලාපයක ම සහ ඉදිරියට ඇතිවන්නා වූ කලාප අධ්‍යාපන බල ප්‍රදේශයකම සඳහා ද කලාප මට්ටමේ විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව බැගින් පිහිටුවිය යුතු ය. ඉහත දැක්වෙන ආයතන විසින් සිදු කරනු ලබන තක්සේරු කමිටු වාර්තා අදාළ කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවට ලබා දිය යුතු වේ. එම කමිටුව පහත සඳහන් වෘත්තිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

## 3.3 කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ සාමාජිකයින්

- නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - විශේෂ අධ්‍යාපන
- නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපන
- විශේෂ අධ්‍යාපන ගුරු උපදේශක/ විශේෂ අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ ගුරුභවතෙකු
- ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරයෙකු
- විශේෂ අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ ගුරුභවතෙකු

ඉහත 3.1හි සඳහන් අනෙකුත් තක්සේරු ආයතනවල කමිටුවෙහි සාමාජිකයින් අවම තිදෙනෙකු සිටිය යුතු අතර ඉන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ම විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුහුණු ප්‍රවීණයන් විය යුතු ය.

දුබලතා සහිත ළමයෙකු තක්සේරුකරණ අවස්ථාවේ දී විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණ වෘත්තිකයන් දෙදෙනෙකු සමඟ කමිටු සාමාජිකයින් තුන්දෙනෙකු අවම වශයෙන් සහභාගි විය යුතු ය. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති අංක 37/2020 දරණ "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියලු ම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය" තුළ මේ පිළිබඳ වැඩිදුර උපදෙස් ඇත.

මෙතෙක් විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදුණු ඉහත ඛණ්ඩවලට අයත් නොවන වෘත්තිකයන් ද, විශේෂ අධ්‍යාපන ප්‍රවීණ/ජ්‍යෙෂ්ඨ ගුරු භවතුන් සහභාගී කරගැනීමට අපොහොසත් අධ්‍යාපන කලාපයන්හි නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් ද මෙම චක්‍රලේඛයේ සඳහන් පරිදි පුහුණුව ලබා එම කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළ හැකි ය.

තව ද සිසුන්ගේ පහසුව සඳහා සියලු ම ප්‍රාථමික ගුරු උපදේශකවරුන් සහ සියලු ම විශේෂ අධ්‍යාපන ගුරුභවතුන්ට ද විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ පුහුණුව ලබා දී අවශ්‍ය පරිදි තක්සේරු කටයුතු සඳහා සහභාගි කර ගැනීමට කටයුතු කළ හැකි ය.

## 3.4 පුහුණුව ලැබූ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ කමිටු සාමාජිකයින්ට බලපත්‍ර ලබාදීම

විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ පුහුණුව ලැබූ තක්සේරු කමිටු සාමාජිකයින්ට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වසර 03කට බලපවත්වන පරිදි තක්සේරුකරණය සහ එයට අනුශාංගික ක්‍රියාවලීන් පවත්වාගෙන යාමට බලය පැවරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබේ. (උපලේඛන අංක 01) මෙම 33/2022 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය උල්ලංඝනය වන ලෙස කටයුතු කිරීම හෝ මෙම කාර්යයයේ යෙදීම පැහැර හැරියහොත් මෙම බලපත්‍රය අවලංගු කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වන්නේ ය.

## 4.0 දුබලතා සහිත ළමයින්ගේ දෙමව්පියන්/භාරකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ

කලාප අධ්‍යාපන කාර්යාලයේ විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලියාපදිංචි දුබලතා සහිත සියලු ම ළමයින්ගේ (Children with Disability) දෙමව්පියන්/භාරකරුවන් සඳහා කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 03ක් සංවිධානය කර අදාළ පාර්ශව සහභාගිකර ගත යුතු ය. සම්මන්ත්‍රණ සංවිධානය සහ කැඳවීම කලාප අධ්‍යාපන කාර්යාලයේ විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු ය. මෙම සම්මන්ත්‍රණ 03 සිදුකිරීමත්, අධ්‍යාපන තක්සේරුකරණය කර අදාළ ක්‍රියාමාර්ග ගැනීම ලියාපදිංචි කරන වර්ෂයේ ඔක්තෝබර් මස 31 වන දිනට පෙර සිදු කළ යුතු ය.

## 4.1 පළමුවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය

දුබලතා සහිත සියලු ම ළමයින්ගේ (Children with Disability) දෙමව්පියන්/භාරකරුවන් සඳහා පවත්වනු ලබන පළමුවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, ප්‍රජා සහ ළමා රෝග විශේෂඥ වෛද්‍ය, කායික හා විකලාංග රෝගීන්ට ප්‍රතිකාර කරන වෛද්‍ය, අක්ෂි විශේෂඥ වෛද්‍ය, උගුර,කන,නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය, මනෝ චිකිත්සක වෛද්‍ය හෝ මනෝ චිකිත්සක, කථන චිකිත්සක, වෘත්තීය චිකිත්සක හා භෞත චිකිත්සක ආදී චිකිත්සකවරුන්ගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය නිලධාරීන්ට සහ ආබාධිත ළමයින් ඇතුළු දෙමව්පියන්/භාරකරුවන්ට පහසු ස්ථානයක පැවැත්විය යුතු ය.

මෙම සම්මන්ත්‍රණය සඳහා අදාළ ළමයා වෙනුවෙන් පහසුකම් සපයන සෑම පාර්ශවයක් ම සහ පවුලේ දෙමව්පියන්/භාරකරුවන් සහභාගි කර ගත යුතු ය.

ඉදිරි පස් අවුරුදු කාලය තුළ දී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක ම විශේෂ අවශ්‍යතා සහිත ළමයින් හඳුනා ගැනීම සඳහා වන මූලික ක්‍රියාවලියක් වන පිරික්සීමේ (Screening) පහසුකම ඇති බහුවිෂයයික කමිටුවක් සහිත මධ්‍යස්ථාන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගොඩනැඟීමට අපේක්ෂා කෙරේ.

උදා:- උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධ ‘ආයතී’ මධ්‍යස්ථානය ඉහත ඡේදයේ දක්වා ඇති සෞඛ්‍ය අංශවල විශේෂඥතාවයෙන් යුතු වෛද්‍යවරුන් ඇතුළු කණ්ඩායමක් විසින් ආබාධ සහිත ළමයින් පිළිබඳ ව පිරික්සීමට ලක් කරනු ලබයි. ගම්පහ දිස්ත්‍රික්කයේ ආබාධ සහිත ළමුන් පිළිබඳව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සහ දෙමව්පිය/භාරකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු අනාගත දුෂ්කරතා එම බහුවිෂයයික කමිටුවේ පිරික්සීමට ලක්කිරීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයට ලබාදීමට සූදානම් කරනු ලැබේ.

මෙහි දී රජයේ රෝහල් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ළමයාට ලබාදෙන ප්‍රතිකාර ක්‍රම, චිකිත්සක ක්‍රම හෝ වෙනත් සෞඛ්‍ය පහසුකම් සහ ප්‍රතිකාර ලබා ගැනීමේ ගැටලු ඇත්නම් ඒවා සඳහා සෞඛ්‍ය අංශ සමඟ සහයෝගිතාවයෙන් ලබාගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සෑම පාර්ශවයක් ම දැනුවත් කළ යුතු ය.

එසේ ම ශිෂ්‍යයාගේ සංවර්ධනය උදෙසා අදාළ පාර්ශවයන්ගේ කාර්යභාරය පිළිබඳ සියලු පාර්ශවයන් දැනුවත් වීම ඉතා වැදගත් වේ.

මෙම සම්මන්ත්‍රණයේ දී දුබලතා සහිත සියලු ම ළමයින්ට (Children with Disability) ආහාරපාන භාවිතය, ඇඳුම් පැළඳුම් භාවිතය, පිරිසිදුකර ගැනීම සහ සනීපාරක්ෂක පහසුකම් භාවිතය වැනි ජීවන නිපුණතා තමන් විසින් ම කර ගැනීම පිළිබඳ යහපුරුදු පුහුණු කළ යුතු බව සහ එම කාර්යයන් සිදු කිරීමේ උපාය මාර්ග පිළිබඳවත් දෙමව්පියන්/භාරකරුවන්ට උපදෙස් දීම/දැනුවත් කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් විසින් කළ යුතු ය.

## 4.2 දෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය

දෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිරිස්වල සහභාගිත්වයෙන් සංවිධානය කළ යුතු ය. එහි දී රජයේ රෝහල් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ළමයාට ලබාදෙන ප්‍රතිකාර ක්‍රම, චිකිත්සක ක්‍රම හෝ වෙන යම් සෞඛ්‍ය හෝ චිකිත්සක පහසුකම් සහ ප්‍රතිකාර ලබා ගැනීමේ ගැටලු ඇත්නම් එම ගැටලු විසඳාලීම සඳහා උපායමාර්ග සැලසීම සහ මඟපෙන්වීම කළ යුතු ය.

මෙහි දී නැවතත් දුබලතා සහිත සියලු ම ළමයින්ට (Children with Disability) තවදුරටත් තනි තනි ව තම සනීපාරක්ෂක පහසුකම් භාවිතය ඇතුළු දෛනික ජීවන ක්‍රියාකාරකම් පිළිබඳ යහපුරුදු පුහුණු කළ යුතු බවට දෙමව්පියන්/භාරකරුවන්ට උපදෙස් දීම/දැනුවත් කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් විසින් කළ යුතු ය.

එසේ ම දුබලතා සහිත සියලු ම ළමයින් (Children with Disability) සමාජගත කිරීම සඳහා අධ්‍යාපනය ලබා දීමේ ඇති වැදගත්කම යටතේ: විශේෂ අධ්‍යාපනය යනු කුමක් ද? අන්තර්කරණ අධ්‍යාපනය යනු කුමක් ද? අන්තර්කරණ අධ්‍යාපනය ලැබීමේ ඇති වැදගත්කම? අධ්‍යාපනය ලබා ගැනීමට සුදුසු ආයතනයකට ළමයා යොමු කිරීමේ වැදගත්කම? විශේෂ අධ්‍යාපන ඒකකවල අධ්‍යාපනය ලබන හෝ විශේෂ පාසලක අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකු සාමාන්‍ය පාසලක අධ්‍යාපනය ලැබීමට සුදුසු වන පරිදි සංවර්ධනය කළ හැක්කේ කෙසේ ද? සහ මෙම සියලු අවස්ථාවන්හි දී දෙමව්පිය කාර්යයභාරය යනා දී කරුණු පිළිබඳ ව දැනුවත් කළ යුතු ය.

ඌනතාව / දුබලතාව හඳුනාගත් මුල් අවධියේ දී ම අවශ්‍ය ප්‍රතිකාර කිරීමෙන්, ළමයාගේ විශේෂ අවශ්‍යතාව හඳුනාගෙන ඒවා සපුරාලීමෙන්, යෝග්‍ය අධ්‍යාපන අවස්ථා සැලසීමෙන් සහ පුහුණු කිරීමෙන් ඔවුන්ගේ දුබලතාවයට පිළියම් යම් තරමකට හෝ සෙවිය හැකි ය. මෙම කරුණු දෙමව්පියන්ට අවබෝධ කර දී ඔවුන්ගේ ද සහය ඇතිව ළමයාට වඩාත් යෝග්‍ය අධ්‍යාපන අවස්ථා ලබාදීමට දෙමව්පියන් දැනුවත් කළ යුතු ය.

ළමයාගේ දුබලතාවය, දෙමාපියන්ගේ ජීවන තත්ත්වය, රැකියාව, විවේකය, සමාජ පරිසරය, ආර්ථික හැකියාව, අධ්‍යාපන සහ සංස්කෘතික පසුබිම මෙන් ම ළමයාගේ සංවර්ධන අවධි අවබෝධ කරගෙන සුදුසු යථාර්ථවාදී ක්‍රම මඟින් ඉගෙනුමට යොමුකිරීම සඳහා මගපෙන්වීම කළ යුතු ය.

දුබලතා සහිත  සෑම ළමයෙකුට ම අධ්‍යාපනය ලබාදීමේ දී අන්‍යයන් සමඟ සහයෝගයෙන් ජීවත්වීමට, අන්‍යයන් සමඟ සහයෝගයෙන් ඉගෙනගැනීමට, අනාගත ජීවිතයේ දී රැවටීම්වලින් තොරව ස්වාධීන ජීවිතයක් ගත කිරීමට සහ වැඩ ලෝකයේ දී අන්‍යයන් සමඟ එකට වැඩ කිරීමට ඉලක්කගතව එම සිසුන් බලවන්තකරණයට; සමාජානුයෝජනයට කටයුතු කළ යුතු ය. එසේ නොවුවහොත් දෙමව්පියන්/භාරකරුවන්ට මුළු ජීවිත කාලය ම මානසික වශයෙන් නිදහස් විය නොහැකි ජීවිතයක් ගත කිරීමට සිදුවන බවටත්, එමෙන් ම තම ළමයා සමාජ යැපෙන්නෙකු බවට පත්විය හැකි බවටත් අවධාරණය කළ යුතු ය.

**4.3 තෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය**

තෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයේ දී දෙමව්පියන් දැනුවත් කිරීමට සංවිධානය කළ පළමුවෙනි සහ දෙවෙනි සම්මන්ත්‍රණවල දී රජයේ රෝහල් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානවල දී ළමයාට ලබාදෙන ප්‍රතිකාර ක්‍රම, චිකිත්සක ක්‍රම හෝ වෙන යම් සෞඛ්‍ය හෝ චිකිත්සක පහසුකම් සහ ප්‍රතිකාර ලබා ගැනීමේ ගැටලු/බාධක/මඟහැරීම් ඇත්නම් ඒවා සඳහා සෞඛ්‍ය අංශ සමඟ සහයෝගය ලබාගත හැකි ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම කළ යුතු ය.

මෙම සම්මන්ත්‍රණයේ දී ළමයා පිළිබඳවත්, ළමයාගේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳවත්, දෙමව්පියන්ගේ අධ්‍යාපනය සහ පවුලේ රෝග ඉතිහාසයක් ඇත්නම් ඒ පිළිබඳවත් සාකච්ඡා කර, ඒ පිළිබඳ අවබෝධයෙන් ළමයා අධ්‍යාපන තක්සේරුකරණයට යොමු කළ යුතු ය.

තෙවන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයෙන් පසුව විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් ළමයා සමඟ සුහදත්වයක් ගොඩනගාගත යුතු අතර පසුව සිදුකරන අධ්‍යාපන තක්සේරුවට එය ප්‍රයෝජනවත් වේ.

කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් එක් එක් ළමයාගේ දෙමව්පියන්ට, ළමයා තක්සේරු කිරීම සඳහා වෙන වෙන ම දින වෙන් කර ලබා දිය යුතු ය. ළමයා ලියාපදිංචි කළ වර්ෂයේ නොවැම්බර් මාසයට පෙර තක්සේරුව සිදු කිරීමට පියවර ගත යුතු ය. එම  සම්මන්ත්‍රණ අවස්ථාවේ දී ම තක්සේරු කමිටුව විසින් ළමයා සමඟ සුහදශීලී ලෙස කටයුතු කරමින් අධ්‍යාපන තක්සේරුකරණයට පසුබිම සකසා ගත යුතු ය.

### 4.4 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයට දුබලතා සහිත ළමයින් යොමු කිරීම

මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් තොරතුරු ලබාගෙන ජනවාරි 31 දිනට වයස අවුරුදු 03 සම්පූර්ණ වී ලියාපදිංචි වූ ළමයින්ට අමතර ව ආබාධ සහිත ළමයින් පහත අංශවලින් ද විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවට යොමු කළ හැකි ය.

1. වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වී එම වෛද්‍ය නිර්දේශ සහිතව යොමු කරන ළමයින්
2. දෙමව්පියන්/භාරකරුවන් විසින් හඳුනාගෙන යොමු කරන ළමයින්
3. නොවිධිමත් අධ්‍යාපන අංශය මඟින් හඳුනා ගෙන යොමු කරන ළමයින්
4. ළමා රැඳවුම් නිවාස, පරිවාස භාරය වැනි ආයතනවලින් යොමුවන ආබාධිත ළමයින්
5. පන්තිභාර ගුරුවරුන් විසින් විද්‍යුත්පති මඟින් යොමු කරන ළමයින්

කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ කමිටුව විසින් මෙම ළමයින්ට අදාළ තක්සේරුකරණය සිදුකර එම කමිටුවේ නිර්දේශය ලබා දිය යුතු ය.

## 5.0 විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදුකිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු

### 5.1 විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදුකරන දිනය සහ වේලාව

❖ ළමයින් තක්සේරු කිරීම සඳහා සෑම සතියක ම අවම එක් දිනයක් හෝ වෙන්කර එම දිනය/දින පිළිබඳ මහජනතාව දැනුවත් කළ යුතු ය

උදා:- පාසල්, රජයේ ආයතන, බැංකු, පොදු ස්ථානවල දැනුවත් කිරීම් සහ පෝස්ටර් ප්‍රදර්ශනය ආදිය මඟින්

❖ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සඳහා රාජකාරි කාලසීමාව යොදා ගැනීම වඩා සුදුසු වේ. එහි දී දෙමව්පියන්ට පැමිණිය යුතු වේලාව පිළිබඳ පූර්ව දැනුවත් කිරීමෙන් ප්‍රමාදයන් සහ අපහසුතා වළක්වා ගැනීමට පියවර ගත හැකි වේ

### 5.2 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයට සුදුසු ස්ථාන හා අනුගමනය කළ යුතු කරුණු

❖ කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සඳහා යෝග්‍ය ස්ථානයක් වෙන්කර ගැනීම සහ යෝග්‍ය පරිසරයක් සකස් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. තක්සේරු කිරීම සිදුකරන ස්ථානය ප්‍රියජනක සහ නිදහස් පරිසරයක් ලෙස සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. අවශ්‍ය උපකරණ, ඉගෙනුම් ආධාරක, සෙල්ලම් බඩු ආදිය සපයා ගැනීම සහ ඒවා පිළිවෙළට පවත්වාගෙන යාම සඳහා විධිමත් ක්‍රමවේද සකසා ගැනීමට කටයුතු කළ යුතු ය.

- විශේෂ අධ්‍යාපන තක්සේරුව සඳහා පැමිණෙන ළමයින්ට මෙන් ම පැමිණෙන දෙමව්පියන්/භාරකරුවන්ට යෝග්‍ය පහසුකම් උපරිම ලෙස සැපයීමට කටයුතු කළ යුතු ය.

- විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සඳහා දෙමව්පියන්/භාරකරුවන් ආබාධ සහිත ළමයා සමඟ පැමිණියහොත් හැකිතාක් එදින ම විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදුකර වාර්තාව ලබා දීමට කටයුතු කළ යුතු ය. යම් දරුවෙකු සඳහා විශේෂ අධ්‍යාපන තක්සේරුව සිදුකිරීමට එක් දිනක් ප්‍රමාණවත් නොවන්නේ නම් අවම දින ගණනකින් තක්සේරුව සිදු කළ යුතු ය.

- ළමයා නොමැතිව පැමිණියහොත් දෙමව්පියන්/භාරකරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන්ට පහසු සහ ආසන්න දිනයක් ලබා දිය යුතු ය.

- විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සඳහා පැමිණීමේ දී රැගෙන ආ යුතු ලේඛන, දරුවා භාවිත කරන විශේෂ උපකරණ හෝ ද්‍රව්‍ය, ආහාරපාන සහ භාවිත කරන ඖෂධ රැගෙන ඒමට දැනුවත් කළ යුතු ය. ඒ සඳහා උපදෙස් පත්‍රිකාවක් සකසා මුද්‍රණය කර ගැනීම පහසු වේ.

- ළමයාට සහ පැමිණෙන පිරිසට සුහද සහ ගෞරවනීය පිළිගැනීමක් ලබා දිය යුතු ය.

- විශේෂ අධ්‍යාපන තක්සේරුව සඳහා ළමයින් පැමිණි විගස ඒ සඳහා යොමු නොකර ළමයා සුදුසු කායික සහ මානසික තත්ත්වයකින් පසුවේ දැ යි ස්ථිර කර ගැනීමෙන් පසු තක්සේරුව ආරම්භ කළ යුතු ය.

- ළමයා වෛද්‍ය ප්‍රතිකාර හෝ ඖෂධ ගන්නේ නම් ඒවා නිවැරදිව ලබාගෙන ඇති දැ යි තක්සේරුකරණයට පෙර පරීක්ෂා කළ යුතු ය. එහෙත් අධික්‍රියාකාරී ළමයෙකු පැමිණියහොත් ඖෂධ ලබා ගැනීමට ප්‍රථම තක්සේරුව සිදු කළ යුතු ය. ඖෂධ ලබා ගැනීමෙන් පසු නැවතත් ළමයාගේ චර්යාව පිළිබඳ නිරීක්ෂණ සටහන් ලබා ගත යුතු වේ. එසේ ම ළමයාගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි විශේෂ අවධානය යොමුකර යෝග්‍ය මට්ටමේ සිටී නම් පමණක් තක්සේරුව සඳහා යොමු කළ යුතු ය

- ළමයාට නිදහසේ හැසිරීමට පරිසරය සැකසිය යුතු ය.

- ළමයාට හුරුපුරුදු ස්ථානයක් ලෙස දැනෙන පරිදි කටයුතු කළ යුතු ය.

- ළමයා සහ පැමිණෙන පිරිස සමඟ සුහදව කථා බහක නිරත විය යුතු ය. කමිටුවේ එක් සාමාජිකයෙකු පමණක් ළමයා සමඟ සම්බන්ධවීමට කටයුතු කළ යුතු ය. අනෙක් සාමාජිකයින් ළමයාට නොදැනෙන ලෙස සහ ළමයාගේ අවධානයට බාධාවක් නොවන පරිදි ළමයාගේ හැසිරීම සූක්ෂම ලෙස නිරීක්ෂණය කළ යුතු ය. නමුත් ඒ බව ළමයාට දැනීමට ඉඩ නොතැබිය යුතු ය.

- ළමයාට හෝ අනෙකුත් අයට පීඩාවක්, අපහසුතාවයක් ඇති නොවන පරිදි ළමයාගේ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට යොමු විය යුතු ය.

- විශේෂ අධ්‍යාපන තක්සේරු පත්‍රිකාවේ සඳහන් ඇතැම් තොරතුරු දෙමව්පියන් සහ ළමයා සමඟ සුහද කථා බහක යෙදෙන අතරතුර එම කතාබහ තුළින් ම සපුරා ගත හැකි ය. ඒ සඳහා සාකච්ඡා මෙහෙයවා ගැනීමට උත්සුක විය යුතු ය.

- එසේ ම ළමයින්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තක්සේරු පත්‍රිකාවේ සම්පූර්ණ කළ යුතු දත්ත සුහද සාකච්ඡාව තුළින් සහ ළමයා නිරීක්ෂණය තුළින් ම සපුරා ගත යුතු ය.

- පරිසරයට සහ පුද්ගලයින්ට ළමයා අනුගත වූ පසු තක්සේරුකරණයට යොමු වීම සුදුසු වේ. එහි දී ද ළමයාට වෙනස් බවක් නොදැනෙන ලෙස සුහදව කටයුතු කිරීමට පියවර ගත යුතු ය.

- තක්සේරු පත්‍රිකාව අනුපිළිවෙළට සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ. එනම් එක් ක්‍රියාකාරකමක් සිදු කරන විට වෙනත් ලක්ෂණ හෝ ක්‍රියාකාරකම් නිරූපණය වන අවස්ථාවල එම ලක්ෂණ සටහන් කරගත යුතු ය. නැවත ඒ සඳහා ක්‍රියාකාරකම් කළ යුතු නොවේ.

  උදා:- 1. දළ චාලක ක්‍රියාකාරකම් තුළ සියුම් චාලක කුසලතා දැකිය හැකි ය
  2. ළමයාගේ සාමාන්‍ය හැසිරීම් රටා තුළ චර්යා හෝ කුසලතා මැනිය හැකි ය

- එසේ ම යෝජිත ක්‍රියාකාරකම් ද අනුපිළිවෙළට කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. ළමයාගේ පවත්නා හැසිරීම් රටාවට, ක්‍රියාකාරිත්වයට අනුගතවෙමින් එම අවස්ථාවට සම්බන්ධ කළ හැකි වෙනත් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම යෝග්‍ය වේ. තක්සේරුකරු නිරන්තරයෙන් ළමයාගේ ඇස් මට්ටමට සමාන්තරව සිට කටයුතු කිරීමට උත්සුක විය යුතු ය. මුණින් අතට පෙරළීමේ සිට දරුවාගේ විවිධ ඉරියව්වූ නිරීක්ෂණය ද අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකරන විට දී ද ඒ හා සමාන ඉරියව්වල සිටිමින් ඇසට ඇස සමායෝජනය වන අයුරින් තක්සේරුකරණයේ යෙදිය යුතු ය.

  උදා:- බිම පෙරළී සිටින විට එම ඉරියව්වේ ද, පැදුරක වාඩි වී සිටී නම් එම ඉරියව්වේ ද සිටිමින් ළමයාට අනුගත වී තක්සේරු කළ යුතු ය

- වෛද්‍ය වාර්තා අනුව දරුවාගේ රෝග ඉතිහාසය, වර්ධන වේගය, වෛද්‍ය ප්‍රතිකාර ආදිය පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය. ඉදිරියේ දී පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (Individualized Education Plan - IEP) සකස් කිරීමේ දී අනුබද්ධව කටයුතු සංවිධානය කිරීමට ක්‍රියාකාරී හැසිරීම් තක්සේරුව (Functional Behavioral Assessments - FBA) වැදගත් වන බැවින් එය ඉතා සූක්ෂමව සහ නිසි පරිදි සිදුවිය යුතු ය. අවශ්‍ය ළමයින් සඳහා චර්යා කළමනාකරණ සැලැස්මක් ද (Behavioral Intervention Plan - BIP) සකස් කිරීම අවශ්‍ය වේ.

- තක්සේරු පත්‍රිකා වර්ග දෙකක් ඇත.

  1. පොදු තක්සේරු පත්‍රිකාව (උපලේඛන අංක 04)
  2. විශේෂ තක්සේරු පත්‍රිකා (උපලේඛන අංක 05,06,07,08,09)

- සෑම ළමයෙකු සඳහා ම පොදු තක්සේරු පත්‍රිකාව සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වන අතර එය පළමුව සම්පූර්ණ කිරීම යෝග්‍ය වේ.

- වෛද්‍ය නිර්දේශ, දෙමව්පිය හඳුනාගැනීම්, සෞඛ්‍ය වෘත්තිකයෙකු හෝ කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් හඳුනා ගන්නා සුවිශේෂී තත්ත්වයන්ට අනුව අනෙක් විශේෂ පත්‍රිකාව සම්පූර්ණ කිරීම ද කළ යුතු ය.

  උදා:- ඔටිසම් තත්ත්වයේ ළමයින් වෙනුවෙන් ඔටිසම් තත්ත්වය සහිත ළමයින් සඳහා තක්සේරු පත්‍රිකාව (උප ලේඛන අංක 05) භාවිත කළ යුතු ය.

  දෘෂ්ටි ඌනතා සහිත ළමයින් වෙනුවෙන් දෘෂ්ටි ඌනතා සහිත ළමයින් සඳහා තක්සේරු පත්‍රිකාව (උප ලේඛන අංක 07) භාවිත කළ යුතු ය.

- සමහර තොරතුරු දෙමව්පියන්ගෙන් ලබාගත යුතු ය. එවන් අවස්ථාවල නිවැරදි ම තොරතුරු ලබා ගැනීමට දෙමව්පියන් මෙහෙය විය යුතු ය. අසත්‍ය හෝ වැරදි තොරතුරු සැපයීමෙන් ළමයාට සිදුවන හානිය පෙන්වා දිය යුතු ය. හැකි සෑම විට ම එම තොරතුරු ළමයා ඇසුරෙන් සාක්ෂාත් කර ගැනීමට උත්සුක විය යුතු ය.

  උදා:- වැසිකිළි භාවිතය පිළිබඳ තොරතුරු
  ආහාර ගැනීම පිළිබඳ තොරතුරු

- පළමුව ළමයාට ස්වාධීනව කළ හැකි ක්‍රියාකාරකමකින් ආරම්භ කර අදාළ නිර්ණායකයන් පිළිබඳ ව පරීක්ෂා කළ හැකි ය. ළමයාට එය තනිව කළ හැකි නම් නැවත ආධාරක හෝ උපකාර (උදවු) ඇතිව කළ හැකි දැ යි පරීක්ෂා කිරීම අවශ්‍ය නොවේ. එසේ වුව ද තක්සේරු පත්‍රිකාවේ ආධාර හෝ උපකාර මඟින් ක්‍රියාකාරකම් මනින නිර්ණායකවලට උපරිම ලකුණු ලබා දීම කළ යුතු ය.

- පොදු තක්සේරු පත්‍රිකාවේ නිර්ණායක සියල්ල ම සම්පූර්ණ කළහොත් ලැබෙන මුළු ලකුණු ගණන 368කි. එය සියයට ප්‍රතිශතයකට ගෙන මෙම උපදෙස් සංග්‍රහයේ 6.1හි අදාළ නිර්දේශ ලබා දිය යුතු ය. එසේ වුව ද අවුරුදු 05ට වඩා අඩු ළමයෙකු තක්සේරුකරණයේ දී පොදු තක්සේරු පත්‍රිකාව සම්පූර්ණ කිරීම සිදුකරන විට තක්සේරුවට ලක් නොකරන නිර්ණායක පවතී නම් එම ඉවත්කරනු ලබන එක් නිර්ණායකයක් සඳහා ලකුණු 04 බැගින් අඩුකර මුළු ලකුණු සංඛ්‍යාව ලබා ගත යුතු ය. අනතුරු ව එම ලකුණු සංඛ්‍යාව ප්‍රතිශතයකට පරිවර්තනය කළ යුතු ය. එම ලකුණු ප්‍රතිශතය අනුව 6.1 සඳහන් නිර්දේශ ලබා දිය යුතු ය.

- උග්‍ර දුබලතා ඇති, චාලක හැකියා නොමැති, බහුවිධ දුබලතා, ස්නායු දුබලතා වැනි ආබාධිත ළමයෙකු තක්සේරු කිරීම සඳහා තක්සේරු කමිටුව එම ළමයා ජීවත්වන ස්ථානයට හෝ ඔහුට පැමිණිය හැකි ස්ථානයකට ගොස් එම තක්සේරුව සිදු කළ යුතු ය.

- දුබලතා සහිත ළමයෙකු තක්සේරුකරණ අවස්ථාවේ දී විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණ වෘත්තිකයන් දෙදෙනෙකු සමඟ කමිටු සාමාජිකයින් තුනක් අවම වශයෙන් සහභාගි විය යුතු ය. පොදු තක්සේරු වාර්තාව අවසානයේ නිර්දේශ සටහන් තැබීම අත්‍යාවශ්‍ය වන අතර තක්සේරු කමිටු සාමාජිකයින් තිදෙනෙකු හෝ සහභාගි වූ සියලු දෙනා ම අත්සන් තැබීම ද කළ යුතු ය.

- ශිෂ්‍ය සාධන ඇගයීම් ක්‍රියාවලියේ දී ලබා දිය යුතු විශේෂ පහසුකම් සහ සහය සේවා සටහන් කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා විභාග දෙපාර්තමේන්තුව ලබා දෙන සේවා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගෙන ඊට අනුගත නිර්දේශ ලබා දිය යුතු ය. එම සහන පාසල් වාර පරීක්ෂණවල දී ද ලබා දෙමින් ජාතික විභාග සඳහා ළමයා සූදානම් කිරීම කළ යුතු ය.

## 6.0 විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ ප්‍රධාන වගකීම

තක්සේරු කමිටුවට යොමු වන සෑම ළමයෙකු ම තක්සේරුකරු යෝග්‍ය අධ්‍යාපන අවස්ථා සැලසීම සඳහා නිර්දේශ ලබාදීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ ප්‍රධාන වගකීම වේ. උදා:- කකුල් දෙක පණ නැති ළමයෙකුට රෝද පුටුවක් ලබා දීම සහ ප්‍රවේශ පහසුකම් සලසා තිබිය යුතු වේ. ඊට අමතරව රෝද පුටුවෙන් ඔබමොබ යාමට, ඒමට ප්‍රවේශ පහසුකම් තිබිය යුතු ය. (2006.10.17 දිනැති හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එහි කාලීන සංශෝධනයන්ට අනුව) මෙලෙසින් සාධාරණ ඉඩ හසරක් (Reasonable Accommodation) ලබා දීමෙන් ඔවුන්ගේ ආබාධිතබව නිසා ඇතිවන බාධාවන්ට පිළියම් ලබා දිය හැකි ය.

දුබලතා සහිත ළමයින් (Children with Disability) කල්වේලා ඇතිව හඳුනාගෙන, තක්සේරුකර ඔවුන්ට සෞඛ්‍යමය, කායික, මානසික, චිත්තවේගීය සහ බුද්ධිමය වශයෙන් අවශ්‍ය සහය සහ අධ්‍යාපනය ලබාදීම මඟින් ඔවුන් සංවර්ධනය කිරීම එම කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ ප්‍රධාන වගකීම වේ.

එම කමිටුව සෞඛ්‍ය, සමාජ සේවා, ළමාරක්ෂක, පරිවාස, කාන්තා හා ළමා කටයුතු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන සමඟ සහයෝගයෙන්, සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතු වේ.

තව ද ප්‍රජා හා ළමා රෝග විශේෂඥ, කායික හා විකලාංග රෝග පිළිබඳ විශේෂඥ, අක්ෂි විශේෂඥ වෛද්‍ය, උගුර,කන,නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය, මනෝ වෛද්‍ය හෝ මනෝ චිකිත්සක, භෞතික චිකිත්සක, වෘත්තීය චිකිත්සක, භාෂා සහ කථන චිකිත්සක, විදුහල්පති, විශේෂ අධ්‍යාපන සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන, විශේෂ අධ්‍යාපන ගුරු උපදේශක, විශේෂ අධ්‍යාපන ගුරුභවතා අතර සම්බන්ධීකරණය සහ යොමු කිරීම් ලබා දීම ද මෙම කමිටුවේ වගකීම වේ.

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් විශේෂ අධ්‍යාපනය ලබද්දීත්, අර්ධ අන්තර්කරණ අවස්ථා හෝ පූර්ණ අන්තර්කරණ අධ්‍යාපන අවස්ථා ලබද්දීත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයින්ට සාධාරණ ඉඩ හසරක් (Reasonable Accommodation) ලබා දීම අත්‍යාවශ්‍ය වේ. ප්‍රවේශ පහසුකම්, ඉගෙනුම් ආධාරක, වර්ධනීය විකල්ප සන්නිවේදන ක්‍රම භාවිතය, ඩිජිටල් හෝ ඩිජිටල් නොවන උපකරණ හා පහසුකම් ලබාදීම, චලතාවය හා දිශානතියට අවශ්‍ය උපකරණ ලබා දීම ශිෂ්‍යයින්ට සාධාරණ පහසුකම් යටතේ ප්‍රමුඛ වේ.

අධ්‍යාපන චක්‍රලේඛ සහ ලියකියවිලිවල ඒ ඒ ළමයාට සුවිශේෂ වූ විශේෂ අධ්‍යාපන අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කෙරෙන බැවින් විශේෂ අවශ්‍යතාවයන් ලබාදීමෙන් පසුව දුබලතා සහිත ළමයින් (Children with Disability) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් (Children with Special Education Needs-Children with SEN) වශයෙන් හඳුන්වනු ලැබේ.

තක්සේරුකරණයට ලක්වන ළමයින් පිළිබඳ දෙමව්පියන්/භාරකරුවන්ගේ කැමැත්ත සහ අවසරය ඇතිව ZACSE කමිටුව සහ පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (Individual Education Plan - IEP) කමිටුව විසින් අවශ්‍ය පියවර ගැනීමට හැකි ය. එහෙත් ඔවුන් පිළිබඳ ඡායාරූප, විස්තර සහ ඔවුන්ගේ අනාගතයට බලපාන කරුණු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත්කිරීම, කමිටුවලින් පිටත දී බාහිර පාර්ශවයන්ට ලබාදීම හෝ මාධ්‍යවල ප්‍රචාරය කිරීම සපුරා තහනම් වේ.

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් (Children with SEN) සඳහා පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් සකස් කිරීම, ඔවුන් ඒකීයකරණය කිරීම සඳහා විදුහල්පතිවරුන්ට නිර්දේශ ලබාදීම, අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම, ශිෂ්‍යයින්ගේ ගැටලු කල්වේලා ඇතිව හඳුනාගෙන ඔවුන්ට සෞඛ්‍යමය, කායික, මානසික, චිත්තවේගීය, සමාජයීය සහ බුද්ධිමය වශයෙන් අවශ්‍ය සහය ලබාදීම මඟින් ඔවුන් සංවර්ධනය කිරීම, පුද්ගලබද්ධ ඉගෙනුම් කමිටුවට මගපෙන්වීම එම කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ වෙනත් වගකීම් වේ.

එලෙස සාධාරණ ඉඩහසරක් ලබාදීම සඳහා වූ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම, උපායමාර්ග සැලසීම, ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ අංශ ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම ද තක්සේරු කමිටුවේ කාර්යයන්ට අයත් වේ.

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් (Children with SEN) අධ්‍යාපන අංශයේ උපරිම විභව්‍යතාවයට සංවර්ධනය කර ගැනීම සඳහා ළමයාගේ අවශ්‍යතාවයන්ට සම්බන්ධ පාසල් මට්ටමේ සියලු පාර්ශවයන් එක්ව කටයුතු කළ යුතු ය. එම කමිටුව පුද්ගලබද්ධ ඉගෙනුම් කමිටුව (Individual Education Plan/Program Committee-IEP Committee) ලෙස හඳුන්වනු ලැබේ. එම කමිටුවට උපදෙස් සහ මඟපෙන්වීම ද තක්සේරු කමිටුව විසින් සිදු කළ යුතු වේ.

විධිමත් අධ්‍යාපන තක්සේරුව සඳහා මෙම තක්සේරු උපකරණ කට්ටලය සකසා ඇති අතර එමඟින් අධ්‍යාපනික තක්සේරුවක් සිදුකර තක්සේරු වාර්තාවල මෙතෙක් සටහන් නොවූ යම් විමසීමක් හෝ තක්සේරු කළ යුතු ක්ෂේත්‍රයක් තිබේ නම් එය තක්සේරු පත්‍රිකාවල ‘සටහන’ යටතේ සටහන් කර ළමයාගේ තක්සේරු වාර්තාවෙන් නිර්දේශ ලබා දීමට කටයුතු කළ යුතු ය.

## 6.1 විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශ

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති සහ අංක 37/2020 දරණ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ 4.3 පරිච්ඡේදය පහත දැක්වේ.

4.3 කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ වාර්තාව තුළින්,

(අ) උග්‍ර දුබලතා ඇති, චලනා හැකියා නොමැති, බහුවිධ දුබලතා, ස්නායු දුබලතා වැනි විශේෂ අවශ්‍යතා ඇති ළමයෙකු නිවසේ සිට සංචාරක ගුරුවරයෙකුගේ මඟපෙන්වීම යටතේ අධ්‍යාපනයක් ලැබිය යුතු බවට,

(ආ) ආධාරක සැපයීමෙන් හෝ පුහුණු කිරීමෙන් චලනා හැකියා සංවර්ධනය කළ හැකි උග්‍ර දුබලතා ඇති ශිෂ්‍යයින් උපකෘත විශේෂ පාසලක අධ්‍යාපනය ලැබිය යුතු බවට,

(ඇ) විශේෂ අධ්‍යාපන ඒකකයක් තුළ විශේෂ අධ්‍යාපන ගුරුභවතෙකුගේ මගපෙන්වීම යටතේ අධ්‍යාපනය ලබාදී සංවර්ධනය කිරීමෙන් පසුව සාමාන්‍ය පාසලක සාමාන්‍ය පන්තියකට ඒකීයකරණය කර අධ්‍යාපනය ලබාදිය හැකි බවට හෝ

(ඈ) විශේෂ අවශ්‍යතා ඇති ළමයෙකු ලෙස සමවයස් ළමයින් සමඟ (සාමාන්‍ය පාසලක) අන්තර්කරණ අධ්‍යාපනය ලැබිය යුතු බවට යන නිර්දේශවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

පොදු තක්සේරුව සහ විශේෂ තක්සේරුව සිදුකර ළමයා ලබා ගන්නා ලකුණුවල ප්‍රතිශත අගය අනුව ඉහත නිර්දේශ ලබාදීමට කටයුතු කළ යුතු ය.

6.1.1 ලකුණු 0 - 25 අතර ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයින්ට 37/2020 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ 4.3 (අ) නිර්දේශය ලබා දිය යුතු ය. එම ළමයින් රජයේ පාසලක ඇතුළත්වීමේ නාම ලේඛනයට නම ඇතුළත් කර "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I" උගන්වා ප්‍රවීණතා මට්ටම්වලට ගෙන ඒම සඳහා සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයෙකු (Mobile/Field Teacher) මඟින් නිවසේ දී ඉගෙන ගැනීමට කටයුතු යෙදිය යුතු ය.

මෙම ළමයින් නිවසේ සිට අධ්‍යාපනය ලැබීමට නිර්දේශ ලබා දීමේ දී 37/2020 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ 4.3 (අ) හි සඳහන් පරිදි සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට වයස අවුරුදු 04 සම්පූර්ණ කරන අවස්ථාවේ දී එම ළමයින් ආසන්න ම පාසලේ ලියාපදිංචියට කටයුතු කිරීම සහ සංචාරක ගුරුවරයෙකු යෙදවීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කිරීමට තක්සේරු කමිටුව කටයුතු කළ යුතු ය. ශිෂ්‍යයින් තිදෙනෙකු සඳහා නිවෙස්වලට ගොස් ඉගැන්වීමට එක ගුරුභවතෙකුට භාර කළ යුතු ය.

එක් ශිෂ්‍යයෙකු හෝ දෙදෙනෙකු සඳහා සංචාරක ගුරුවරයෙකු යොදවන්නේ නම් එම ගුරුවරයා පත්වීම් ලබා ඇති පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයේ හෝ අන්තර්කරණ අධ්‍යාපනයට සහය වීම සඳහා ඉතිරි කාලය යෙදවිය යුතු ය.

ප්‍රවීණතා මට්ටම්වලට පැමිණීමෙන් පසුව ඔහු ලියාපදිංචි කර ඇති පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයක් ඇත්නම් එම ඒකකයට ඇතුළත් කර "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II" උගන්වා ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට කටයුතු කළ යුතු ය. එම නිපුණතාවලින් ප්‍රවීණතාවයට පත් වූ පසුව පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම කළ යුතු ය. එම පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයක් නොමැති නම් ශිෂ්‍යයාට ආසන්නයේ පිහිටි විශේෂ අධ්‍යාපන ඒකකයකට ඇතුළත් කර අදාළ පහසුකම් ලබා දිය යුතු ය. ප්‍රවීණතා මට්ටමට පැමිණි පසු පළමුවන ශ්‍රේණියට ඒකීයකරණය කළ යුතු ය. ඒකීයකරණය (Intergration Education) යනු සාමාන්‍ය ශිෂ්‍යයින් සමඟ ඒකාබද්ධ අධ්‍යාපනයක් ලබාදීම වේ.

6.1.2 එසේ වුව ද එම ශිෂ්‍යයාගේ බුද්ධි මට්ටම ඉහළ නම් උග්‍ර ආබාධිත වුව ද 4.3 (ආ) නිර්දේශය ලබා දිය හැකි ය. 0 - 25 අතර ලකුණු ලබා ගන්නා එම ළමයින් උපකෘත විශේෂ පාසලක හෝ රජයේ විශේෂ පාසලක අධ්‍යාපනය ලැබිය හැකියැයි තීරණය කරනු ලබන ළමයින් මේ මට්ටමේ වුව ද එම පාසල්වලට ඇතුළත්කර "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I"හි සඳහන් නිපුණතා මට්ටම් සහ නිපුණතාවන් පරීක්ෂාකර ඒ සඳහා සංවර්ධනය කළ යුතු ය. ඉන් පසුව "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II" උගන්වා ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට නිර්දේශය ලබා දිය යුතු ය. ප්‍රවීණතා මට්ටමට පැමිණි පසු පළමුවන ශ්‍රේණියට ඒකීයකරණය කළ යුතු ය.

6.1.3 ලකුණු 26 - 50 අතර ලබා ගන්නා ශිෂ්‍යයින්ට 4.3 (ආ) හෝ 4.3 (ඇ) නිර්දේශ ලබා දිය යුතු ය. ඒ සඳහා උපකෘත විශේෂ පාසලකට/රජයේ විශේෂ පාසලකට හෝ විශේෂ අධ්‍යාපන ඒකකයක් ඇති පාසලක විශේෂ අධ්‍යාපන ඒකකයක අධ්‍යාපනය ලබාදීම සඳහා සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට වයස අවුරුදු 04 සම්පූර්ණ කරන අවස්ථාවේ දී එම ළමයින් පාසලේ ඇතුළත්වීමේ නාම ලේඛනයට ඇතුළත් කළ යුතු ය. එම ශිෂ්‍යයින්ට "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II" උගන්වා ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට කටයුතු කළ යුතු ය. එම නිපුණතාවලින් ප්‍රවීණතාවයට පත් වූ පසුව පළමුවන ශ්‍රේණියට ඒකීයකරණය කළ යුතු ය.

6.1.4 ලකුණු 51 - 75 අතර ලබා ගන්නා ශිෂ්‍යයින්ට 4.3 (ඇ) නිර්දේශය ලබා දිය යුතු ය. "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II" හි නිපුණතාවලින් යම් ප්‍රමාණයක් සඳහා දැනටමත් එම ළමයින් ප්‍රවීණතාවයට පත් වී ඇති බැවින්

සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට වයස අවුරුදු 04 සම්පූර්ණ කරන අවස්ථාවේ දී එම ළමයින් ඉතිරි නිපුණතා මට්ටම් සහ නිපුණතා අත්පත් කර දීමට සලස්වා කෙටි කලකින් ප්‍රවීණතා මට්ටම්වලට ගෙන ඒම සඳහා කටයුතු කළ යුතු ය. එහි දී ප්‍රාථමික පළමුවන අදියරේ ගුරු මාර්ගෝපදේශය සහ අදාළ අනුවර්තන ක්‍රම භාවිත කරගෙන අවශ්‍ය පරිදි ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමෙන් පළමුවන ශ්‍රේණියට ඒකීයකරණය කළ යුතු ය.

6.1.5 ලකුණු 76 - 100 අතර ලබා ගන්නා ශිෂ්‍යයින්ට 4.3 (ඇ) නිර්දේශය ලබා දිය යුතු ය. එම ළමයින්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති සහ අංක 37/2020 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ සඳහන් පරිදි පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතු ය. ඒ වෙනුවෙන් සෑම පාසලක ම විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපන පිළිබඳ අංශ ප්‍රධාන විසින් ප්‍රාථමික සහ ද්විතීයික පන්තිවල ඉගෙනුම ලබන එම ශිෂ්‍යයින්ට අවශ්‍ය සහයවීම කළ යුතු ය. පාසල්හි පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ ඉල්ලුම්පත් කැඳවන විට මෙම ලැයිස්තු පළාත් සභා පාසල් සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද, ජාතික පාසල් සම්බන්ධයෙන් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද අනුමැතියෙන් ප්‍රාථමික පන්ති සහිත අදාළ පාසල්වලට යැවිය යුතු ය.

එම ළමයින් 1939 අංක 08 දරණ අධ්‍යාපන ආඥා පනතේ 37වෙනි වගන්තිය අනුව නිකුත්කර ඇති 2016.04.20 දිනැති 1963/30 අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචිය ඇති පළමුවෙනි ශ්‍රේණියට කිනම් හෝ ගණයකින් සුදුසුකම් ඇති ළමයින් ඒ ඒ ගණයේ දුබලතාවය පදනම් කරගෙන පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කළ යුතු ය.

විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව ලබා දෙන නිර්දේශය ළමයාගේ අධ්‍යාපන අයිතිය සහ ඔවුන්ගේ අනාගතය ද තීරණය කරන බැවින් නිවැරදි නිර්දේශ ලබාදීම අතිශය වැදගත් වේ.

- **විශේෂ සටහන්:-** සෑම විට ම ලකුණු මත පමණක් පදනම් ව නිර්දේශ ලබා දීම නොකළ යුතු ය. යම් ළමයෙකුගේ ඌනතාවය අනුව දළ චාලක, සියුම් චාලක කුසලතා ආදිය දැක්විය හැකි/නොහැකි විය හැකි ය. එවිට ළමයාගේ සමස්ත ලකුණු අඩුවිය හැකි ය. එහෙත් ළමයාගේ බුද්ධිමය හැකියාව සාමාන්‍ය මට්ටමේ පවතී නම් එම ළමයාට සාමාන්‍ය අධ්‍යාපන අවස්ථා ලැබීමට නිර්දේශ ලබා දිය යුතු අතර දුබලතාවය බව අවම කර ඉගෙනීමට අවශ්‍ය පහසුකම් මොනවාද යන්න නිර්දේශ කළ යුතු ය. එම නිර්දේශවලට පදනම් වූ කරුණු සටහන යටතේ ලිවිය යුතු ය.

- සටහන, යොමු කිරීම සහ නිර්දේශ ලිවීමෙන් පසුව තක්සේරු කමිටු සාමාජිකයන් පහත පරිදි අත්සන් තබා තක්සේරු වාර්තා අදාළ අංශවලට ඉදිරිපත් කළ යුතු ය.

  කමිටු සාමාජික 1 (නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - විශේෂ අධ්‍යාපන)
  කමිටු සාමාජික 2 (නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපන)
  කමිටු සාමාජික 3 (ගුරු උපදේශක - විශේෂ අධ්‍යාපන)
  කමිටු සාමාජික 4 (ගුරු උපදේශක - ප්‍රාථමික අධ්‍යාපන)
  කමිටු සාමාජික 5 (ජ්‍යෙෂ්ඨ විශේෂ අධ්‍යාපන ගුරුවරයා)

## 7.0 නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය

### 7.1 මෙම උපදෙස් සංග්‍රහයෙහි 6.1.1 සහ 6.1.2 නිර්දේශ ලබා ඇති උග්‍ර ආබාධිත ශිෂ්‍යයින් නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය

අධ්‍යාපනය ලබාදීමට සංචාරක/ක්ෂේත්‍ර ගුරුභවතාට (Mobile/Field Teacher) වගකීම් පැවරෙන එක් එක් ශිෂ්‍යයෙක් සම්බන්ධයෙන් ඉගැන්වීමට පෙර ශිෂ්‍යයාගේ ප්‍රවේශ මට්ටම හඳුනා ගත යුතු ය. මේ සඳහා උපලේඛන අංක 10 භාවිත කළ යුතු ය. එහි සඳහන් නිපුණතා මට්ටම් සහ නිපුණතාවලට ප්‍රවේශයේ දී දැනටමත් ශිෂ්‍යයා අත්පත්කර ගෙන ඇති නිපුණතා මට්ටම් සහ නිපුණතා හඳුනා ගත යුතු ය. ශිෂ්‍යයින් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ

සංග්‍රහය I" හි සඳහන් ශිෂ්‍යයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවට අනුව නිපුණතා මට්ටම් සහ නිපුණතාවලට පැමිණ ඇත්නම්; අදාළ කොටුවේ දිනය හා නිල් පාටින් '√' ලකුණක් යෙදිය යුතු ය. ගුරුභවතාගේ කෙටි අත්සන සහ දිනය ද අදාළ කොටුවල තැබිය යුතු ය. බොහෝ ශිෂ්‍යයින් මෙම නිපුණතා මට්ටම් සහ නිපුණතා අත්පත්කරගෙන නොමැති නිසා සියල්ල පරීක්ෂා කිරීම අවශ්‍ය නොවේ. ශිෂ්‍යයා අත්පත්කරගෙන ඇති නිපුණතා පරීක්ෂාකර තහවුරු කිරීම ගුරු උපදේශක විසින් සිදු කළ යුතු ය. ඉතිරි නිපුණතා ඉගැන්වීම සඳහා IEP මගින් සුදුසු පරිදි සැලසුම්කර ඉගැන්වීම සහ සාධනය තහවුරු කර ගෙන ප්‍රවීණතාවයට පත් කළ යුතු ය.

## 7.2 මෙම උපදෙස් සංග්‍රහයෙහි 6.1.3 සහ 6.1.4 නිර්දේශ ලබා ඇති ශිෂ්‍යයින් නිපුණතා සහ නිපුණතා මට්ටම්වලට පැමිණ ඇත් දැ යි නිරීක්ෂණය

උපකෘත විශේෂ පාසලකට/රජයේ විශේෂ පාසලකට/විශේෂ අධ්‍යාපන ඒකකයකට අධ්‍යාපනය සඳහා යොමුකරන ළමයා පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඇතුළත් කළ යුතු ය. ඉන් අනතුරුව විශේෂ අධ්‍යාපන ගුරුභවතාට භාරවෙන ශිෂ්‍යයෙකුට "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I" ඉගැන්වීමට අවශ්‍ය වන්නේ නම් ඉහත 7.1 අනුව කටයුතු කළ යුතුය. නැතිනම් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවේ පරිදි නිපුණතා මට්ටම් සහ ඊට අදාළ නිපුණතා කරා පැමිණ ඇත්නම් උපලේඛන අංක 11හි ළමයා වෙනුවෙන් වෙන්කරන ලද පිටපතෙහි අදාළ නිපුණතා මට්ටම සහ නිපුණතාව යටින් ඇති හිස් කොටුවෙහි නිල් පාට '√' ලකුණක් දමා ඊට යටින් ඇති කොටුවෙහි ගුරුභවතාගේ කෙටි අත්සන තබා ඊටත් යටින් ඇති කොටුවෙහි මාසය සහ දිනය කෙටියෙන් යොදා ගුරුභවතා විසින් අදාළ සටහන් තැබිය යුතු ය.

## 8.0 වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොත (Augmantative Student Record Book - ASRB)

දෙමව්පියන්/භාරකරුවන් විසින් ශිෂ්‍යයාගේ වර්ධනය පිළිබඳ විශේෂ වාර්තා පොතක් (වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොත - Augmantative Student Record Book - ASRB) පවත්වාගෙන යා යුතු ය.

ශිෂ්‍යයා පාසලට ප්‍රවේශ වීමේ දී "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I"හි සඳහන් තක්සේරු පත්‍රිකාව 01ට අනුව නිපුණතා මට්ටම් සහ නිපුණතාවලට පැමිණ ඇත්නම්; උපලේඛන අංක 10හි ළමයා වෙනුවෙන් වෙන්කරන ලද පිටපතෙහි අදාළ නිපුණතා මට්ටම් සහ නිපුණතා යටින් ඇති හිස් කොටුවෙහි අදාළ සංකේත යොදා සටහන් තැබිය යුතු ය. එහි දී තක්සේරු කිරීමේ පරිමාණය අනුව තවදුරටත් උදවු අවශ්‍ය නම් 1 සංකේතය පැන්සලෙන් යෙදිය යුතු ය. දුෂ්කරතා පෙන්නුම් කරයි නම් පැන්සලෙන් 2 සංකේතය යෙදිය යුතු ය. 1 සහ 2 සංකේතය යෙදූ නිපුණතා සහ නිපුණතා මට්ටම් සඳහා ඉතිරි කොටු සම්පූර්ණ නොකළ යුතු ය. සාර්ථකව කරයි නම් නිල් පාට කාබන් පෑනෙන් '√' ලකුණක් දමා ඊට යටින් ඇති කොටුවෙහි ගුරුභවතාගේ කෙටි අත්සන තබා ඊටත් යටින් ඇති කොටුවෙහි මාසය සහ දිනය කෙටියෙන් යොදා ගුරුභවතා විසින් අදාළ සටහන් තැබිය යුතු ය. සාර්ථකව කරයි නම් ඉන් හැඟෙන්නේ නිපුණතාවයට/ප්‍රවීණතාවට පැමිණ ඇති බවයි.

දෙමව්පියන්/භාරකරුවන් විසින් විශේෂ අධ්‍යාපන ගුරුභවතාගේ උපදෙස් ලබා ගනිමින් ශිෂ්‍යයාගේ ප්‍රගතිය අනුව ඒ ඒ සංවර්ධන අවස්ථා වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) දින යොදා සටහන් කළ යුතු ය. ගුරුභවතාගේ උපදෙස් පරිදි ASRB වාර්තා පොත පවත්වාගෙන යාම දෙමව්පියන්/භාරකරුගේ වගකීමකි. එම සටහන් පොත IEP කමිටුවේ ප්‍රගති සමාලෝචනය සඳහා රැගෙන ආ යුතු ය.

එම වාර්තා පොත පරීක්ෂා කර උපලේඛන අංක 10හි හෝ 11හි සඳහන් තක්සේරු පත්‍රිකාවේ නිපුණතා මට්ටම් සහ නිපුණතා අත්පත් කරගෙන ප්‍රවීණතාව ලබාගෙන ඇත්නම් ගුරු උපදේශක විසින් ගුරුභවතාගේ ඊට අදාළ '√' ලකුණ, අත්සන, දිනයට යටින් ඇති කොටුවල ගුරු උපදේශක රතු පාටින් '√' ලකුණක් දමා ඊට යට කොටුවෙහි දිනය යොදා තහවුරු කළ යුතු ය. අත්පත් කරගත්

නිපුණතාවයට (ප්‍රවීණතාවයට පත් වූ) යටින් දෙමව්පියන්/භාරකරුවන්ගේ එකඟතාවය ඇති බවට ඔවුන්ගේ අත්සන ඊට යටින් ලබාගත යුතු ය. එමෙන් ම ගුරුභවතා විසින් දෙමාපියන්ගේ වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි ද (ASRB) ශිෂ්‍යයා අත්පත්කර ගත් ප්‍රවීණතාවන් පිළිබඳව සටහන් තබා තහවුරු කළ යුතු ය. සෑම පාර්ශවයක් විසින් ම ළමයින්ගේ සෞඛ්‍ය වර්ධන කාඩ්පත මෙන් වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොත (ASRB) ආරක්ෂාකර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය.

මෙලෙසින් “අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II”හි නිපුණතා මට්ටම් සහ නිපුණතා කරා පැමිණ ඇත්දැයි උපලේඛන අංක 11හි සඳහන් තක්සේරු පත්‍රිකාව 02 ආශ්‍රයෙන් සම්පූර්ණ කර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. (ඉහත 7.1 අනුව කටයුතු කරන්න)

## 9.0 පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම්/වැඩසටහන (Individual Education Plan/Program - IEP)

සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයාගෙන් (Mobile/Field Teacher) නිවසේ දී ඉගෙනුම ලබන ශිෂ්‍යයාගේ දිගුකාලීන අධ්‍යාපන ඉලක්කය විය යුත්තේ පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයකට ඇතුළත් වී අධ්‍යාපනය ලැබීමට සූදානම් කිරීමයි. පළමුවෙන් ම මේ සඳහා ZACSE කමිටුවේ නිර්දේශය පරිදි අදාළ ළමයාව පාසලක් තෝරා දී එහි ඇතුළත්වීමේ නාම ලේඛනයට ළමයා ඇතුළත් කළ යුතු ය. එවැනි ළමයින් තිදෙනෙක් සඳහා එක් සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයෙක් පත් කළ යුතු ය. එම ගුරුවරයා එක් එක් ශිෂ්‍යයාගේ නිවසට ගොස් ඒ ඒ ශිෂ්‍යයාව තක්සේරු/ඇගයීම් කළ යුතු ය.

“අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I”හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවේ සඳහන් පරිදි ශිෂ්‍යයා අත්පත්කරගෙන ඇති නිපුණතා මට්ටම් සහ නිපුණතා පැන්සලෙන් 1,2 නිල් පැහැති කාබන් පෑනෙන් √ ලකුණ යෙදිය යුතු ය. නිල් පැහැති කාබන් පෑනෙන් √ ලකුණ යෙදූ නිපුණතා හැර ඉතිරි නිපුණතා මට්ටම් ඇතුළත් ව ඇති ප්‍රධාන නිපුණතාවලට/අනු නිපුණතා මට්ටම්වලට අදාළ වර්ෂය තුළ දී ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන විෂය පරාසය ශිෂ්‍යයාට උගන්වන ගුරුභවතා විසින් හඳුනාගෙන පුද්ගලබද්ධ පාඩම් සැලසුම් (Individual Lesson Plan - ILP) සකස් කළ යුතු ය.

මින් ඉදිරියට මෙම සැලැස්ම පුද්ගලබද්ධ අධ්‍යාපන සැලස්ම හෝ වැඩසටහන (Individual Education Plan/Program) කෙටියෙන් IEP ලෙස හඳුන්වනු ලැබේ. චක්‍රලේඛයේ සියලු කරුණු ඇතුළත් ආදර්ශ පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම (IEP) උපලේඛන අංක 12 මඟින් සහ ඒ ඒ සමෝධානිත විෂය සඳහා වෙන වෙන ම පවත්වා ගත යුතු ආදර්ශ පාඩම් සැලසුම (LP) උපලේඛන 13 මඟින් ඉදිරිපත් කර ඇත.

## 9.1 වේලාසනින් මැදිහත්වීම සහ පුද්ගලබද්ධ පවුලේ සේවා සැලසුම (Individual Family Service Plan (IFSP))

විශේෂ අධ්‍යාපන කලාපයීය තක්සේරුකරණ කමිටුව විසින් උග්‍ර ආබාධ සහිත ළමයෙකු හඳුනාගෙන පාසල්ගත කිරීමෙන් පසුව සියලු පාර්ශව එකතු වී ගුරුවරයා විටින් විට පැමිණ උගන්වන දේවල් තහවුරු කිරීම සඳහා නැවත නැවත පුහුණුවීම අවශ්‍ය වේ.

මෙහි දී පුද්ගලබද්ධ පවුලේ සේවා සැලසුම (Individual Family Service Plan (IFSP)) සකස්කර ඒ අනුව ළමයා සමඟ කටයුතු කරන ආකාරය ඇතුළත් සැලැස්මක් සකස් කළ යුතු ය. එය දෙමව්පියන් විසින් පවත්වාගනු ලබන වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) මුල් පිටුවේ සටහන් කළ යුතු ය. අවශ්‍ය නම් IEP ක්‍රියාත්මක වන සෑම ළමයෙකුට ම සහ පුද්ගලබද්ධ පවුලේ සේවා සැලසුම (IFSP) බැගින් සකස් කළ හැකි ය. IEP සාදන සෑම විට ම ඒ අනුව IFSP සකස් කළ යුතු ය. උපලේඛන අංක 14 යටතේ IFSP ආදර්ශයක් අමුණා ඇත.

ප්‍රදේශයෙන් ප්‍රදේශයට, පළාතෙන් පළාතට එය ගැළපෙන පරිදි සකස්කර ක්‍රියාත්මක කළ හැකි ය. එහෙත් මූලික වශයෙන් පහත සඳහන් කරුණු එයට ඇතුළත් විය යුතු ය.

1. ළමයා සහ ළමයාගේ පවුලේ තොරතුරු
2. ශිෂ්‍යයාගේ වර්තමාන සංවර්ධන තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ පහත සඳහන් අංශ ප්‍රජානන, භාෂණය සහ භාෂාව, සන්නිවේදන හැකියාව
3. දළ චාලක කුලසතා, සියුම් චාලක කුසලතා, පෙනීම, ඇසීම ඇතුළත්ව ළමයාගේ ශාරීරික සංවර්ධනය
4. සමාජ සහකම්පනය
5. අනුවර්තන හැසිරීමේ හැකියාව, උදවු ඇතිව ස්වයං සංවර්ධන හැකියාව
6. පවුලේ ආරවුල්, ගැටලු, අවශ්‍යතා, ප්‍රමුඛතා සහ ශිෂ්‍යයා වෙනුවෙන් දැනට නිවසේ ඇති සම්පත්
7. සුවිශේෂ නිමැවුම්
8. සේවා ලැබීමට නියමිත ළමයා පදනම් කර ගත් ඔහුගේ අද්විතීය අවශ්‍යතා වෙනුවෙන් කළ යුතු විශේෂිත සේවාවන් (කලාතුරකින් කළ යුතු, නොකඩවා කළ යුතු සහ ඒවා ළමයාට සපයන ක්‍රමවේද)
9. සේවාවන් සපයන ස්වභාවික පරිසරය
10. මැදිහත්වීමේ සේවාවන් ආරම්භ කරන දින, සපයන දින සහ නිමැවුම් ලැබිය යුතු දින
11. සේවා සපයන්නාගේ නම (පවුලේ මව, පියා, සහෝදරයා ආදීන්ගේ නම ලියන්න) සහ සේවා සම්බන්ධීකාරකගේ නම
12. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයා තුළ ඇති කිරීමට බලාපොරොත්තුවන චර්යාත්මක වෙනස්කම් තුළින් සිදුකිරීමට බලාපොරොත්තු වන පරිවර්තනය

## 9.2 සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයෙකුගෙන් (Mobile/Field Teacher) ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සඳහා පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම්/වැඩසටහන් (Individual Education Plan/Program - IEP)

"අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I" මඟින් නිවසේ දී අධ්‍යාපනය ලබන උග්‍ර දුබලතා ඇති ළමයින්ගේ IEP සකස් කිරීමේ දී කායික හා විකලාංග රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු හෝ භෞත චිකිත්සකවරයෙකුගේ මගපෙන්වීම ඇතිව නිපුණතා මට්ටම් සහ නිපුණතා තීරණය කළ යුතු ය.

උදා:- දෑත් සහ දෙපා ඔසවමින් චලනය කරයි යන නිපුණතාවයට ශිෂ්‍යයා සංවර්ධනය කරද්දී ශිෂ්‍යයාගේ කකුලේ ආබාධයක් තිබේ නම් උඩුබැලි අතට වැතිර සිටියදී දෙපා ඉහළට ඔසවයි නැමැති නිපුණතා මට්ටම එලෙසින් ක්‍රියාත්මක කිරීමට නො හැකි ය.

පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුමක් සකස් කිරීමේ දී එම සැලැස්ම තුළ අවශ්‍ය පරිදි චර්යාත්මක මැදිහත්වීමේ සැලැස්මක් (Behavioral Intervention Plan (BIP), ධනාත්මක හැසිරීමට මැදිහත්වීම, සහයෝගය සහ සෘණාත්මක හැසිරීම් නිශේධනය කිරීමේ සැලැස්මක් (Positive Behavioral Interventions Supports & Negative Behavioral Prohibition Plan) - (PBIS & NBNP) සකස් කළ යුතු ය. පුද්ගලබද්ධ ක්‍රමවේද තුළින් ශිෂ්‍යයා බලවන්ත කළ යුතු ය. IEP සැලැස්මෙහි ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන තත්ත්වය/මට්ටම සංවර්ධනය සඳහා පාසලේ පාර්ශව/දෙමාපිය පාර්ශව/කලාප අධ්‍යාපන කාර්යාල පාර්ශව සහ ප්‍රතිකාර ලබාදෙන පාර්ශවවල කාර්යභාරයන් වෙන වෙන ම පැහැදිලි කළ යුතු වේ. එමෙන් ම එම සැලැස්ම තුළ ශිෂ්‍යයාගේ දැනට පවතින මට්ටම පිළිබඳ චර්යාත්මක වෙනසක් ඇති වූ විට නිපුණතාවයෙන් ප්‍රවීණතාවට පැමිණි බව සුවිශේෂීව සහ මැනිය හැකි ලෙස සඳහන් කළ යුතු ය.

උග්‍ර දුබලතා ඇති, නිවසේ දී අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්ගේ IEP හි දිගුකාලීන අරමුණ පාසලක විශේෂ අධ්‍යාපන ඒකකයට පැමිණ අධ්‍යාපනය ලබා ගැනීමට සූදානම් කිරීමයි. එසේ නොහැකි නිවසේ දී අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්ගේ දිගුකාලීන අරමුණ විය යුත්තේ ස්වාධීන ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නිපුණතා ලබාදීමයි.

“අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I” ඉගැන්වීම සඳහා භාවිත කිරීමේ දී ඔබට හමුවන ශිෂ්‍යයින් තුළ චිත්තවේග පාලනයට යොමුකිරීම, යහ පුරුදු ඇති කිරීම, ආත්ම විශ්වාසය ගොඩනැඟීම, ඉදිරියට නව ඉගෙනුම් අවස්ථා වර්ධනයට ඉඩ සැලසීම, නිවැසියන් සමඟ වැඩකිරීමේ අවස්ථා ලබාදීම, ජීවිතය නව අභියෝගවලට මුහුණ දිය හැකි ආකාරයේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් ඉගැන්වීමට පිවිසිය යුතු ය.

එදිනෙදා ජීවිතයට අවශ්‍ය සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර පුහුණු කිරීම, යහපත් වචන භාවිතයට සහ අයහපත් වචන නිශේධනයට හෙවත් අධෛර්ය කිරීමට කටයුතු කිරීම, අවධානය යොමු කිරීම සඳහා හැකි තරම් ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් යොදා ගැනීම, ළමයාගේ සවන්දීමේ හැකියාව වර්ධනය කිරීම, කරනු ලැබූ ක්‍රියාකාරකම් නැවත නැවත සිතීමට යොමු කිරීම, ළමයාගේ චිත්තවේගීය අවශ්‍යතා සඳහා අවස්ථාව ලබාදීම, කැමතීම, නින්ද, උදාසීනබව, ධෛර්යමත්බව, අවබෝධ කරමින් මිත්‍රශීලී පරිසරයක් තුළ “අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I”හි අදාළ නිපුණතා අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

අනුමත පුද්ගලබද්ධ පාඩම් සැලසුමට අනුකූලව ශිෂ්‍යයාට ඉගැන්විය යුතු ය. විශේෂ අධ්‍යාපන ගුරුභවතා විසින් ප්‍රවීණතා මට්ටම් අත්පත්කර ගත් සහ නිපුණතාවයෙන් ප්‍රවීණතාවයට පත් වූ ශිෂ්‍යයින් සඳහා අදාළ නිපුණතා පත්‍රිකාවේ අදාළ නිපුණතා මට්ටම් සහ නිපුණතා සඳහා ප්‍රවීණතාව ලබා ඇත්නම් නිල්පාටින් ‘√’ ලකුණ ලකුණු කළ යුතු ය. මාස් පතා ගුරු උපදේශකවරයෙකු විසින් දෙමව්පියන්/භාරකරු සමඟ උගන්වන ගුරුවරයා සමඟ නැවත එම නිපුණතාවලින් ශිෂ්‍යයා ප්‍රවීණතාව ලබා ඇත් දැ යි තහවුරු කර ගත යුතු ය.

තහවුරුකර ගත් නිපුණතා සඳහා නිල් පාට ‘√’ ලකුණ ඇති කොටුවේ ම රතු පාටින් ‘√’ ලකුණ දැමිය යුතු ය. විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I”හි සඳහන් තක්සේරු පත්‍රිකාව 01ට අනුව නිපුණතා මට්ටම් සහ නිපුණතාවලට පැමිණ ඇත්නම්; උපලේඛන අංක 11හි ළමයා වෙනුවෙන් වෙන්කරන ලද පිටපතෙහි අදාළ නිපුණතා මට්ටම් සහ නිපුණතා යටින් ඇති හිස් කොටුවෙහි අදාළ සංකේත යොදා සටහන් තැබිය යුතු ය.

එහි දී තක්සේරු කිරීමේ පරිමාණය අනුව තවදුරටත් උදවු අවශ්‍ය නම් 1 සංකේතය පැන්සලෙන් යෙදිය යුතු ය. දුෂ්කරතා පෙන්නුම් කරයි නම් පැන්සලෙන් 2 සංකේතය යෙදිය යුතු ය. 1 සහ 2 සංකේතය යෙදූ නිපුණතා සහ නිපුණතා මට්ටම් සඳහා ඉතිරි කොටු සම්පූර්ණ නොකළ යුතු ය. සාර්ථකව කරයි නම් නිල් පාට කාබන් පෑනෙන් ‘√’ ලකුණක් දමා ඊට යටින් ඇති කොටුවෙහි ගුරුභවතාගේ කෙටි අත්සන තබා ඊටත් යටින් ඇති කොටුවෙහි මාසය සහ දිනය කෙටියෙන් යොදා ගුරුභවතා විසින් අදාළ සටහන් තැබිය යුතු ය. සාර්ථකව කරයි නම් ඉන් හැඟෙන්නේ නිපුණතාවයට/ප්‍රවීණතාවට පැමිණ ඇති බවයි.

මෙහි දී දෙමව්පියන්/භාරකරුට සහභාගිවීමට හැකි වුව ද, නොහැකි වුව ද ඔවුන් භාරයේ ඇති වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) ශිෂ්‍ය නිපුණතා සංවර්ධන තීරුවෙහි සටහන් තැබිය යුතු ය. (ගුරුවරයා සහ දෙමාපියන්ගේ සටහන් දෙක ම පරීක්ෂා කර තීරණ ගැනීම සඳහා)

පුද්ගලබද්ධ පාඩම් සැලසුම සකස්කර අනුමතකර මාස 03ක් ක්‍රියාත්මක කිරීමෙන් පසු IEP කමිටුව රැස් විය යුතු ය. ශිෂ්‍යයාගේ IEP සැලැස්මට අනුව මාස 03ක් තුළ දී ඉගැන්වූ පසු හඳුනාගත් ගැටලු, ශිෂ්‍යයාගේ ඉගෙනීමේ වේගය, ශිෂ්‍යයාගේ විවිධත්වය අනුව අවම විභව්‍යතාවයට පැමිණීමට අපහසු නිපුණතා මට්ටම් සහ නිපුණතා පිළිබඳ සාකච්ඡා කළ යුතු ය.

සැලසුම් කරන ලද වේගයට වඩා වැඩි වේගයෙන් ශිෂ්‍යයා ඉගෙන ගන්නේ නම් එය ද සාකච්ඡා කළ යුතු ය. එම කරුණු සලකා බලා සියලු පාර්ශවයන්ගේ එකඟතාව ඇති ව IEP සැලැස්ම සංවර්ධනය කිරීම හෝ වෙනස් කිරීම සිදු කළ හැකි ය. ඒ අනුව සැලසුම තුළ ඇති ඉලක්ක තවදුරටත් වැඩි කිරීම හෝ ශිෂ්‍යයාගේ අවබෝධ කර ගැනීමේ සහ ඉගෙනීමේ වේගයට අනුව ඉලක්ක මට්ටම පහළට ගෙන ඒම කළ හැකි ය. ශිෂ්‍යයාගේ විවිධත්වය අනුව ඇතැම් ඉගෙනුම්

මට්ටම් සංශෝධනය කරගැනීම හෝ නිපුණතා ප්‍රාප්ති මට්ටම සංශෝධනය කිරීම හෝ වර්ධනීය විකල්ප සන්නිවේදන ක්‍රම මඟින් ඇගයීම් හා තක්සේරු කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදු කළ හැකි ය.

සැලසුම සකස් කළ දින සිට වාරයෙන් වාරයට තක්සේරු/ඇගයීම් සිදුකර වසර අවසානයේ දී ශිෂ්‍යයින් අදාළ ප්‍රවීණතාවලට ළඟා වී ඇත්නම් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I"හි සඳහන් ශිෂ්‍යයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකා අංක 01 සහ 02 (උපලේඛන 10 සහ 11) අනුව දින යොදා ප්‍රවීණතාවයට සහ නිපුණතා මට්ටම්වලට පැමිණීම ලකුණු කළ යුතු ය. නැවත ඊ ළඟ වර්ෂය සඳහා පුද්ගලබද්ධ පාඩම් සැලසුම් සකස් කළ යුතු ය. පෙර ප්‍රවීණතාවට ළඟා වී නොමැති නිපුණතා මට්ටම් සහ නිපුණතා තිබේ නම් ඒවා ද අනතුරුව සකසන IEP සැලැස්මට ඇතුළත් කළ යුතු ය. මෙලෙසින් තමාට භාර වෙන ශිෂ්‍යයින් තිදෙනාට වෙන වෙන ම IEP සැලසුම් සකස් කළ යුතු ය.

සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයෙකු (Mobile/Field Teacher) යටතේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ගේ IEP සැලැස්මේ කෙටිකාලීන සුවිශේෂ අරමුණු විය යුත්තේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ I, IIහි සඳහන් නිපුණතාවලින් අදාළ වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ යුතු යැයි සැලසුම් කළ ශිෂ්‍ය විවිධත්වයට අනුව හඳුනාගත් නිපුණතාවලට අදාළ පාඩම් අංක වේ. මීට අමතරව අනුවර්තන ක්‍රම දැන ගත යුතු ය. ඒ පිළිබඳව වැඩිදුර විස්තර 15වෙනි පරිච්ඡේදයේ දක්වා ඇත.

මීට අමතරව මූලික බ්‍රේල් ක්‍රමවේදය සහ සංඥා භාෂාව ඉගැන්වීම සඳහා ද සංචාරක ගුරුවරයා ප්‍රවීනත්වයක් ලබා තිබිය යුතු ය. සංඥා සහ බ්‍රේල් ක්‍රමවේදය භාවිත කිරීමට පුහුණුව ලැබූ සංචාරක ගුරුවරුන් පූර්ණ අන්ධ සිසුන්ගේ සහ පූර්ණ බිහිරි සිසුන්ගේ නිවෙස්වලට ගොස් මූලික බ්‍රේල් සහ සංඥා පුහුණුව ලබා දිය යුතු ය.

### 9.3 උපකෘත විශේෂ පාසලේ/රජයේ විශේෂ පාසලේ/විශේෂ අධ්‍යාපන ඒකකයේ ගුරුභවතාගෙන් ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සඳහා පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම්/වැඩසටහන් (Individual Education Plan/Program - IEP)

පළමුවෙන් ම ZACSE කමිටුවේ නිර්දේශය පරිදි සුදුසුකම් ලබන ළමයින් (අදාළ වර්ෂයේ ජනවාරි 31 දිනට වයස අවුරුදු 04 සම්පූර්ණ වූ) අදාළ පාසලේ ඇතුළත්කිරීමේ ලේඛනයේ ලියාපදිංචි කළ යුතු ය. මෙවැනි ළමයින් පස්දෙනෙක් එක් ගුරුවරයෙකු භාරයට පත් කළ යුතු ය. මුල් මාසය තුළ දී අදාළ ගුරුභවතා විසින් උප ලේඛන අංක 11 භාවිතා කරමින් ශිෂ්‍යයා දැනට සිටින මට්ටම හඳුනා ගත යුතු ය.

"අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි සඳහන් අංශ 08ක් යටතේ ඇති තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවට අනුව ශිෂ්‍යයා ප්‍රවීණතාවට පත් වූ නිපුණතා සහ නිපුණතා මට්ටම් ගුරු උපදේශක විසින් තහවුරු කළ යුතු ය. ඉතිරි නිපුණතා මට්ටම් සහ ප්‍රධාන නිපුණතාවලට අදාළ වසර ඇතුළත දී ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන විෂය පරාසය ශිෂ්‍යයාට උගන්වන ගුරුභවතා විසින් හඳුනාගෙන පුද්ගලබද්ධ පාඩම් සැලසුම් (Individual Lesson Plan - ILP) සකස් කළ යුතු ය. මෙහි දී කෙටි කාලීන ඉලක්ක වශයෙන් IEP තුළ ලිවිය යුත්තේ පාඩම් අංක ය.

පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම සකසා අනුමතකර මාස 03ක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදවීමෙන් පසුව IEP කමිටුව රැස්විය යුතු ය. එහි දී IEP සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් පසු ශිෂ්‍යයාගේ හඳුනාගත් ගැටලු, ඉගෙනීමේ වේගය, ශිෂ්‍යයා අනුව අවම විභව්‍යතාවයට පැමිණීමට අපහසු නිපුණතා මට්ටම් සහ නිපුණතා පිළිබඳ සාකච්ඡා කළ යුතු ය. සැලසුම් කරන ලද වේගයට වඩා වැඩි වේගයෙන් ශිෂ්‍යයා ඉගෙන ගන්නේ නම් එය ද සාකච්ඡා කළ යුතු ය.

එම කරුණු සලකා බලා සියලු පාර්ශවයන්ගේ එකඟතාව ඇති ව IEP සැලැස්ම සංවර්ධනය කිරීම හෝ වෙනස් කිරීම සිදු කළ හැකි ය. ඒ අනුව සැලසුම තුළ ඇති ඉලක්ක තවදුරටත් ඉහළ දැමීම

හෝ පහළ ඉලක්කවලට ගෙන ඒම කළ හැකි ය. ශිෂ්‍යයාගේ විවිධත්වය අනුව ඇතැම් ඉගෙනුම් මට්ටම් සංශෝධනයකර ගැනීම හෝ නිපුණතා ප්‍රාප්ති මට්ටම සංශෝධනය කිරීම හෝ වර්ධනීය විකල්ප සන්නිවේදන ක්‍රම මඟින් ඇගයීම් සහ තක්සේරු කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදු කළ හැකි ය. සැලසුම සකස් කළ දින සිට පාසල් වාරයෙන් වාරයට තක්සේරු/සම්භවන සහ සමපිණ්ඩිත ඇගයීම් සිදුකර වසර  අවසානයේ දී ශිෂ්‍යයින් අදාළ ප්‍රවීණතාවලට ළඟා වී ඇත්නම් “අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II”හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකා අංක 02 (උපලේඛන අංක 11) අනුව දින යොදා ප්‍රවීණතාවයට සහ නිපුණතා මට්ටම්වලට පැමිණීම ලකුණු කළ යුතු ය. ඒ අනුව වසරක් සඳහා පාඩමෙන් පාඩමට, ඒකකයෙන් ඒකකයකට පුද්ගලබද්ධ පාඩම් සැලසුම්/බහුතල ඉගැන්වීම් පාඩම් සැලසුම් සකස්කර ඉගැන්විය යුතු ය. පෙර ප්‍රවීණතාවට ළඟා වී නොමැති කොටස් තිබේ නම් ඒවා ද අනතුරුව සකසන IEP සැලැස්මට ඇතුළත් කළ යුතු ය. මෙලෙසින් තමාට භාර වෙන ශිෂ්‍යයින් පස්දෙනා හෝ අදාළ ශිෂ්‍යයින් පිළිබඳ වෙන වෙන ම IEP සැකසිය යුතු ය.

නිපුණතා අත්කර දීමට අපහසු සිසුන් සිටිනම් එම ළමයින් සඳහා ද පුද්ගලබද්ධ අධ්‍යාපන සැලසුම් (IEP) සකස් කළ යුතු ය. IEP සකස් කිරීමේ දී ඒ තුළ අඩංගු විය හැකි කරුණු 10වෙනි පරිච්ඡේදයේ 10.3 වගන්තිවල දක්වා ඇත. ඒවා භාවිතයට ගත යුතු නම් තවදුරටත් උක්ත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇති නිපුණතා මට්ටම් සහ නිපුණතා සාක්ෂාත්කර ගැනීම සඳහා 18වෙනි පරිච්ඡේදයේ පාසල් නවීකරණ සහ අනුවර්තන ක්‍රම ද, ශිෂ්‍යයා වෙනුවෙන් ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි අනුවර්තන ක්‍රම ද මෙම ශිෂ්‍යයින් සඳහා භාවිත කළ යුතු ය.

“අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I සහ II” හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවේ සඳහන් නිපුණතා මට්ටම් සහ නිපුණතා කරා පැමිණ ඇත්නම් ඒ බව උපලේඛන අංක 10 සහ 11හි අදාළ පරිදි ගුරුභවතා විසින් ලකුණු කළ යුතු ය. එසේ ලකුණු කිරීමේ දී පළමුවන කොටුවේ නිල් පාටින් ‘√’ ලකුණ හෝ අදාළ සංකේතය යෙදිය යුතු ය. දෙවෙනි කොටුවේ දිනය යෙදිය යුතු ය. තුන්වන කොටුවෙහි ගුරුභවතාගේ කෙටි අත්සන තැබිය යුතු ය.

මෙලෙසින් අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශ වන අවස්ථාවේ දී ශිෂ්‍යයා තුළ පවතින නිපුණතා මට්ටම් සහ නිපුණතා මාසයක කාලයක් ඇතුළත දී නිරීක්ෂණය කළ යුතු අතර ඒ අනුව ශිෂ්‍යයා අධ්‍යාපනය අතින් දැනට සිටින ස්ථානය හඳුනාගෙන ස්ථානගත කළ යුතු ය. අදාළ ගුරුවරයා නිරීක්ෂණය කළ පත්‍රිකාව සෑම මාසයක් අවසානයේ දී ම නිවැරදි දැයි ශිෂ්‍ය හැසිරීම්, දක්ෂතා, ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් විශේෂ අධ්‍යාපන ගුරු උපදේශක  විසින් දිනය යොදා තහවුරු කළ යුතු ය. මෙහි දී  දෙමව්පියන්/භාරකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) සටහන් ද ගුරු උපදේශක විසින් විමසිල්ලට ලක් කළ යුතු ය.

විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සිදු කිරීමෙන් පසුව ලකුණු 0 - 25 අතර ලබා ගන්නා යම් ළමයෙකු සඳහා “අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II” ට අමතරව අවශ්‍ය වන්නේ නම් “අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I” ට අදාළ නිපුණතා මට්ටම් හා නිපුණතා ඇතුළත්කර IEP සකස් කළ යුතු ය.

## 10.0 IEP කමිටු රැස්වීම

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ නිපුණතා ඉහළ නැංවීම සඳහා පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව ශිෂ්‍ය ප්‍රගතිය පරීක්ෂා කරමින් ශිෂ්‍යයාගේ සංවර්ධනයට අවශ්‍ය උපාය මාර්ග වඩාත් ඵලදායී අයුරින් ගොඩනැගීමට සහ ඊට අදාළ සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා මෙම කමිටුව පිහිටුවිය යුතු වේ. එම කමිටුව පහත පාර්ශවකරුවන්ගෙන් සමන්විත වේ.

1. පන්තිභාර ගුරුභවතා (ප්‍රාථමික පන්තියට ඇතුළත් වූ පසු ඉගැන්වීමට නියමිත ගුරුභවතා)
2. විශේෂ අධ්‍යාපන ගුරුභවතා (දැනට ඉගැන්වීම කරනු ලබන ගුරුභවතා)
3. සහය චිකිත්සකවරු (සහභාගිවීමට සිටී නම් වැදගත් ය.)
4. විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන
5. ශිෂ්‍යයාගේ දෙමව්පියන්/භාරකරු
6. විශේෂ අධ්‍යාපන සම්පත්දායක/ගුරු උපදේශක
7. නියෝජ්‍ය විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පතිවරු කිහිපදෙනෙක් සිටිනම්, නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන)

## 10.1 IEP කමිටුව රැස්විය යුතු අවස්ථා

ශිෂ්‍යයා තුළ පවතින නිපුණතා මට්ටම් සහ නිපුණතා මාසයක කාලයක් ඇතුළත දී නිරීක්ෂණය කළ යුතු අතර ඒ අනුව ශිෂ්‍යයා අධ්‍යාපනය අතින් දැනට සිටින ස්ථානය හඳුනාගෙන ස්ථානගත කර පළමුවෙනි වතාවට IEP සැලැස්මක් සකස් කිරීම සහ අනුමැතිය සඳහා රැස්විය යුතු ය. එම IEP සැලැස්ම මාස 03ක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව ශිෂ්‍යයාගේ ඉගෙනීමේ වේගය අනුව සැලැස්මක් සංශෝධනය කිරීම, ප්‍රතිපෝෂණය කිරීම හෝ සංවර්ධනය සඳහා දෙවනුව IEP කමිටුව රැස්විය යුතු ය. එම රැස්වීම අවසානයේ වසර සඳහා ම සංශෝධිත IEP සැලැස්ම සකස් කරනු ලැබිය යුතු ය. මින් ඉදිරියට මාස තුනෙන් තුනට ප්‍රගති සමාලෝචනය සඳහා සහ ශිෂ්‍යයා ප්‍රවීණතාවය ලබා ගත් නිපුණතාවයන් තහවුරු කිරීම සඳහා IEP කමිටුව රැස්විය යුතු ය. රැස්වීමේ වාර්තා විශේෂ අධ්‍යාපන ඒකකය/විශේෂ අධයාපන සම්පත් මධ්‍යස්ථාන තුළ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. එම වාර්තා පොතෙහි නව රැස්වීම් වාර්තාව ලිවීමට පෙර පැමිණි කමිටු සාමාජිකයින්ගේ නම, තනතුර ලියා අත්සන් තැබිය යුතු ය.

## 10.2 IEP සැලැස්ම සැකසීම

එම කමිටුවේ සහභාගිත්වයෙන් සහ එකඟතාවයෙන් IEP සැලැස්ම සකස් කළ යුතු ය. හැකි සෑම විටක ම ගුරු උපදේශකවරයෙකු සහභාගි වීම වැදගත් වේ. ශිෂ්‍යයා විවිධ විෂයයන් ඉගෙන ගන්නා විට ඉගෙනුම ලබන විෂයයන්වලට අදාළ ගුරු උපදේශකවරයෙකුගේ ද සහය හෝ සහභාගිත්වය අවශ්‍ය වේ.

අදාළ වර්ෂය සඳහා ඉගැන්වීමට සකස් කරන ලද IEP සැලැස්ම තුළ ශිෂ්‍යයාගේ සංවර්ධනය විය යුතු අංශ, ගුරුවරයා ඉටු කළ යුතු කාර්යභාරය, ගුරු උපදේශකගේ කාර්යභාරය, චිකිත්සකවරුන් සහභාගි වන්නේ නම් ඔවුන්ගේ කාර්යභාරය සහ ප්‍රවීණතාවට පත්වන ශිෂ්‍යයින්ගේ එම ප්‍රවීණතාවට පත් වූ ඉගෙනුම් ඵලය සම්බන්ධයෙන් දෙමව්පියන්/භාරකරු අනුගමනය කළ යුතු අනාගත ක්‍රියාමාර්ග සාකච්ඡා කර අවබෝධ කර ගැනීම සිදු කළ යුතු ය. දෙමව්පියන් නිවසේ දී ශිෂ්‍යයාගේ වර්ධනය පිළිබඳ සටහන් තබන වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන විසින් මේ පිළිබඳ දෙමව්පියන්ට උපදෙස් දුන් නිශ්චිත සටහනක් ලිඛිතව තැබිය යුතු ය.

සකසන ලද පුද්ගලබද්ධ පාඩම් සැලසුම් (IEP) අනුගමනය කරමින් උගන්වා යම්කිසි නිපුණතාවක් පිළිබඳ ශිෂ්‍යයෙකු ප්‍රවීණතාවට පත්වන්නේ නම් එය ඔහුගේ/ඇයගේ ජීවන පුරුද්දක් බවට පත් වේ. එනිසා එම නිපුණතාව ළමයාට ම අත්විඳීමට ඉඩකඩ සැලසිය යුතු අතර, මින් ඉදිරියට එම ප්‍රවීණතාව සම්බන්ධයෙන් දෙමව්පියන්ට මැදිහත් නොවන ලෙසට දෙමව්පියන්/භාරකරුවන්ට උපදෙස් ලබා දිය යුතු ය.

ශිෂ්‍යයා සමාජානුයෝජනය වෙමින් ස්වකීය පෞරුෂත්වය සංවර්ධනය කර ගැනීමට නම් දෙමව්පියන්/භාරකරුවන්ගේ නොමඳ සහය අත්‍යවශ්‍ය බව දෙමව්පියන්ට/භාරකරුවන්ට පැහැදිලි කිරීම කමිටුවේ වගකීම වේ. මේ පිළිබඳ ව ද දෙමව්පියන් නිවසේ දී ශිෂ්‍යයාගේ වර්ධනය පිළිබඳ

සටහන් තබන වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන විසින් දෙමව්පියන්ට උපදෙස් දුන් නිශ්චිත සටහනක් ලිඛිතව තැබිය යුතු ය.

උදා:- ශිෂ්‍යයා කමිසයක් තනිව හැඳ ගැනීමේ නිපුණතාව ප්‍රවීණතාවට පත් වී ඇත්නම් ශිෂ්‍යයාට ම ජීවිත කාලය පුරාවට ම දෙමව්පියන්/භාරකරුවන් එම කාර්යය සඳහා මැදිහත් නොවීමට කටයුතු කළ යුතු ය. එතෙකුදු වුව නායයෑම්, සුනාමි, ගංවතුර, අසනීපවීම් වැනි ශිෂ්‍යයාට ස්වාධීනව කටයුතු කළ නොහැකි තත්ත්වයක් පැනනැගුණහොත් ඒ සඳහා දෙමව්පියන්/භාරකරුවන් සහය දැක්විය යුතු ය.

සංචාරක ක්ෂේත්‍ර ගුරුභවතා හෝ උපකෘත විශේෂ පාසලේ/රජයේ විශේෂ පාසලේ/විශේෂ අධ්‍යාපන ඒකකයේ විශේෂ අධ්‍යාපන ගුරුභවතා විසින් පාසලේ දී උගන්වන සංකල්පයක් ළමයාට තහවුරු කිරීම සඳහා IEP කමිටුවේ උපදෙස් පරිදි දෙමව්පියන් විසින් නැවත නැවත එය නිවසේ දී ඉගැන්විය යුතු ය. තම ළමයාගේ නිපුණතා මට්ටම් සහ නිපුණතා සංවර්ධනය උදෙසා පාසලේ දී ඉගෙන ගන්නා දේ තහවුරු වන තෙක් නැවත නැවත ප්‍රායෝගිකව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. එහි දී විශේෂ අධ්‍යාපන ගුරුභවතාගේ ද උපදෙස් ලබා ගනිමින් ළමයාගේ ප්‍රගතිය මැනීමට ඒ ඒ සංවර්ධන අවස්ථා වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) දින යොදා සටහන් කළ යුතු ය. IEP කමිටුවේ ප්‍රගති සමාලෝචන අවස්ථාවේ දී ASRB වාර්තා පොත පරීක්ෂාකර අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ද කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

## 10.3 IEP සැලැස්මක් සකස් කිරීමේ දී අඩංගු විය යුතු කරුණු

IEP සැලැස්ම ඉහත පරිච්ඡේදවල සඳහන් එක් එක් අවස්ථා සඳහා සුදුසු පරිදි වසරක කාලයක් සඳහා සකස් කළ යුතු ය. අවශ්‍ය පරිදි IEP ක්‍රියාත්මක වන ළමයාගේ මට්ටම අනුව 13.1හි සඳහන් දිගුකාලීන ඉලක්කය ඉටුකර ගැනීම සඳහා සකස් කළ යුතු ය.

- ශිෂ්‍යයාගේ නම, ලිපිනය, උපන්දිනය, දෙමව්පියන්ගේ නම්, දුරකථන අංකය, ඊ මේල්, වට්ස්ඇප්, හදිසියක දී දැනුම් දිය යුතු අයගේ නම සහ දුරකථන අංකය, පදිංචි ස්ථානය
- ශිෂ්‍යයාගේ වර්තමාන සාධන මට්ටම
- දිගුකාලීන අරමුණු
- කෙටිකාලීන අරමුණු
- සුවිශේෂී සහ මැනිය හැකි අධ්‍යාපන ඉලක්ක
- ළමයා දියුණු කිරීමට අවශ්‍ය අත්‍යවශ්‍ය සේවා සහ පහසුකම්
- එම සේවා සහ පහසුකම් සපයා ගන්නා ආකාරය
- ශිෂ්‍යයාගේ භෞතික සහ මානව සම්පත් අවශ්‍යතා
- ශිෂ්‍යයාගේ ශක්තීන්/දුබලතා/අවස්ථාවන්/තර්ජන පිළිබඳ පැතිකඩ
- ශිෂ්‍යයා රුචි, අරුචි දේ
- සංවර්ධනය කළ යුතු චර්යා කළමනාකරණ කුසලතා
- ළමයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන නිපුණතා
- වසර තුළ දී සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන නිපුණතා ("අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවලින් නිපුණතා අංක පමණක් සටහන් කළ යුතු ය. නැතිනම් ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන චර්යා වශයෙන් මැනිය හැකි නිපුණතා ලිවිය යුතු ය)
- ගුරු උපදේශකගේ / විශේෂ අධ්‍යාපන ගුරුභවතාගේ / දෙමව්පියන්/භාරකරුගේ / අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම / කාර්යභාරය
- සහයක සේවා සපයන අය සිටී නම් ඔවුන්ගේ කාර්යභාරය (උදා:- අනධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය නායක, සහය චිකිත්සක ආදී වශයෙන්)
- මාස තුනෙන් තුනට රැස්වෙන IEP කමිටු තීරණ අනුව ප්‍රතිපෝෂණ සටහන් (නිපුණතා ඉලක්ක අඩු වැඩි කිරීම ආදී වූ)
- IEP කමිටු සාමාජිකයන්ගේ නම් සහ අත්සන්
- විදුහල්පති විසින් අනුමත කළ බව

විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශ මත විශේෂ අධ්‍යාපනය මගින් සංවර්ධනය වී හෝ නොවී සාමාන්‍ය පන්ති කාමරවල ඉගෙනුම ලබන සියලු සිසුන් වෙනුවෙන් ශිෂ්‍ය පැතිකඩ සකස් කිරීමේදී විශේෂ අධ්‍යාපන හා අන්තර්කරණ අංශ ප්‍රධාන විසින් සාමාන්‍ය ගුරු භවතුන්ට ශිෂ්‍ය සංවර්ධනයට අවශ්‍ය පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතු ය. එමෙන් ම විෂය මාලාව අනුවර්තනය පිළිබඳවත් පාසල් මට්ටමේ සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රම පිළිබඳවත් එම අංශ ප්‍රධාන පුහුණු වී සිටිය යුතු ය.

### 10.4 IEP සැලැස්මෙහි දිගු කාලීන ඉලක්ක

1. නිවසේ දී ඉගෙනුම ලබන උග්‍ර ආබාධිත ශිෂ්‍යයින් පාසලට ඇතුළත් වී අධ්‍යාපනය ලැබීමට සංවර්ධනය කිරීම
2. උපකෘත විශේෂ පාසලක/රජයේ විශේෂ පාසලක/විශේෂ අධ්‍යාපන ඒකකයක ඉගෙනුම ලබන ශිෂ්‍යයින් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි නිපුණතා සම්පූර්ණකර පළමුවෙනි ශ්‍රේණියට ඒකීයකරණය කිරීම සහ ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම
3. හය වෙනි ශ්‍රේණියේ සිට අන්තර්කරණ අධ්‍යාපනය ලබමින් කණිෂ්ඨ, ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම
4. කනිෂ්ඨ, ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයින් අන්තර්කරණ අධ්‍යාපනය ලබමින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත් කිරීම
5. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත්ව අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට ඇතුළත් කිරීම
6. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත්/අසමත් වූවන්ට 13 වසරක අධ්‍යාපනය ලබා දීම
7. අ.පො.ස.(උසස් පෙළ) සමත් ව උසස් අධ්‍යාපනය ලබා දීම
8. වෘත්තීය පුහුණුවකට ඇතුළත් කිරීමට සූදානම් කිරීම / තෘතියික අධ්‍යාපනය ලබා දීම
9. ස්වාධීන ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීම
10. වෙනත් සුවිශේෂී අවස්ථා (අදාළ කරුණු සඳහන් කළ යුතු ය)

### 10.5 හැසිරීම සඳහා මැදිහත්වීමේ සැලසුම් (Behaviarol Intervention Plan - BIP)

හැසිරීම සඳහා මැදිහත්වීමේ සැලසුම (Behaviarol Intervention Plan - BIP) අනුව විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයේ දී ළමයින් තුළ පවත්නා නුසුදුසු චර්යා ඉවත් කිරීමටත්, යහපත් චර්යා තහවුරු කිරීමට සහ සංවර්ධනය කිරීමටත් පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් (Individual Lesson Plan - ILP) සැකසිය යුතු ය. ශිෂ්‍යයා අන්තර්කරණ අධ්‍යාපනයට යොමු කිරීම සඳහා මෙම හැසිරීම සඳහා මැදිහත්වීමේ සැලසුම (BIP) IEP සැලසුම් කිරීමේ දී ප්‍රබල අවධානයක් ලබා දිය යුතු වේ. මෙම හැසිරීම සඳහා මැදිහත්වීමේ සැලසුම (BIP) චර්යා කළමනාකරණ සැලසුම (Behaviarol Managment Plan - BMP) වශයෙන් ද හඳුන්වනු ලැබේ.

## 11.0 ශිෂ්‍යයාගේ විවිධත්වයට ගරුකරමින් සහ ආමන්ත්‍රණය කරමින් IEP කමිටුවේ එකඟතාවය මත ප්‍රාථමික අධ්‍යාපනයේ පළමුවන, දෙවන සහ තෙවන අදියර ක්‍රියාත්මක කිරීම

අන්තර්කරණ අධ්‍යාපනය හෝ ඒකීයකරණ අධ්‍යාපනය යටතේ ප්‍රාථමික ශ්‍රේණිවල ඇතුළත් කරන ළමයින් සම්බන්ධව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමේ දී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකර කටයුතු කළ යුතු ය. සම වයස් ළමයින් සමඟ පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනයක් ලබන ශිෂ්‍යයාගේ විවිධත්වයට ගරු කරමින් වර්ධනීය සහ විකල්ප සන්නිවේදනය (Augmantative and Alternative Communication - AAC) භාවිත කරමින් ද, උපකාරක තාක්ෂණය (Assistive Technology - AT) සහ විකල්ප උපකාරක තාක්ෂණය (Alternative Assistive Technology - AAT) භාවිත කරමින් ද ඔවුන්ගේ විභව්‍යතා උපරිම මට්ටමට සංවර්ධනය කිරීම සිදුවිය යුතු ය.

පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක නොවන අවස්ථාවේ දී එනම් ප්‍රාථමික පළමුවන, දෙවන සහ තෙවන අදියර වල දී සම වයස්වල ළමයින් සමඟ අධ්‍යාපනය නොලබද්දී විශේෂ

අවශ්‍යතා සහිත ළමයින් 05ක් දක්වා විශේෂ අධ්‍යාපන ගුරුභවතෙකු භාරයට පත් වන්නේ ය. එම ළමයින් පස්දෙනා එක් පන්තියක හෝ පන්ති කිහිපයකට ඇතුළත් වී අධ්‍යාපනය ලබනවා විය හැකි ය. සියලු ම ළමයින් පිළිබඳ ව සම භාරකාරත්වය අදාළ සාමාන්‍ය පන්ති භාර ගුරුභවතා සහ විශේෂ අධ්‍යාපන ගුරුභවතා යන දෙදෙනා විසින් ම දැරිය යුතු ය. එනම් විශේෂ අධ්‍යාපන ඒකකයෙන් පළමුවන ශ්‍රේණියට ඒකීයකරණය කරන ලද ශිෂ්‍යයින්ට ප්‍රාථමික අධ්‍යාපනය ලබන ශ්‍රේණිවල දී තවදුරටත් විශේෂ අධ්‍යාපන පුහුණු/උපාධි ලැබූ ගුරුභවතෙකුගේ සහය ඇතිව අධ්‍යාපනය ලැබිය හැකි ය.
ඒකීයකරණය කරනු ලබන ශිෂ්‍යයින් දිනපතා ප්‍රාථමික සාමාන්‍ය පන්ති කාමරයේ ඉගෙනුම ලබන අතර විටින් විට කාලපරිච්ඡේදයක් හෝ දෙකක් විශේෂ අධ්‍යාපන ඒකකයට ගෙන්වා ගෙන සාමාන්‍ය පන්ති කාමරයේ දී සම්පූර්ණ කර ගත නොහැකි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කරා සංවර්ධනය කිරීම විශේෂ අධ්‍යාපන ගුරුභවතා විසින් කළ යුතු ය.

ප්‍රාථමික විෂයමාලාව අනුවර්තන ක්‍රම භාවිත කරමින් ද, වර්ධනීය සහ විකල්ප සන්නිවේදනය (AAC) භාවිත කරමින් ද, උපකාරක තාක්ෂණය (AT) සහ විකල්ප උපකාරක තාක්ෂණය (AAT) භාවිත කරමින් ද, සුවිශේෂ ඉගෙනුම් ආධාරක භාවිත කරමින් ද ඔවුන්ගේ විභව්‍යතා උපරිම මට්ටමට සංවර්ධනය කිරීම සිදුවිය යුතු ය. විශේෂ අධ්‍යාපන ගුරුභවතා විසින් මෙම ශිෂ්‍යයින් පස්දෙනා සඳහා IEP සැලසුම් සකස්කර ඉගැන්විය යුතු ය.

විශේෂ අධ්‍යාපන ගුරුවරයෙකුගේ මගපෙන්වීම යටතේ විශේෂ අධ්‍යාපන ඒකකයේ සහ ප්‍රාථමික පන්තිවල ප්‍රාථමික අධ්‍යාපනය ලබන ළමයින්ගේ IEPහි දිගුකාලීන අරමුණ විය යුත්තේ හය ශ්‍රේණියේ දී හෝ ඊට පෙර සාමාන්‍ය ගුරුවරුන්ගෙන් තම පන්තියේ ඉගෙනුම ලබන සමවයස් ළමයින්ගේ සහය ඇතිව පූර්ණ අන්තර්කරණ අධ්‍යාපන අවස්ථා සම්පාදනයට අවකාශ ලබාදීමයි.

මෙහි දී දිනකට කාලපරිච්ඡේද දෙකක් මව්බස සහ ගණිතය විශේෂ අධ්‍යාපන ඒකකයේ දී ඉගැන්විය යුතු අතර ඒ සඳහා නොවිධිමත් අධ්‍යාපන සාක්ෂර උපදේශකවරුන් සඳහා නිකුත්කර ඇති මව්බස සිංහල/දෙමළ පොත් සහ ගණිතය පොත් මෙන් ම ඒ ඒ ශ්‍රේණියට නියමිත පෙළපොත්, වැඩපොත් සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද යොදා ගත යුතු ය. එයට අමතරව ජාතික අධ්‍යාපන ආයතනය නිකුත් කරනු ලබන විෂයමාලා අනුවර්තනය කිරීමේ උපදෙස් සංග්‍රහයට අනුව අවශ්‍ය අනුවර්තන ක්‍රම ඇතිව විවිධත්වයෙන් යුතු සිසුන්ට ගැළපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු ය. අනෙක් අවස්ථාවල දී ප්‍රාථමික ගුරුභවතාගේ මඟපෙන්වීම සහ විශේෂ අධ්‍යාපන ගුරුභවතාගේ සහය ඇතිව ළමයින් සමඟ මුසුවෙමින් ක්‍රියාකාරකම් පාදකව හවුල් ඉගැන්වීමේ ක්‍රමවේදය ද යොදා ගනිමින් අන්තර්කරණ අධ්‍යාපන අවස්ථා උත්පාදනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රාථමික දෙවන සහ තෙවන අදියරවලදී ද විශේෂ අධ්‍යාපන ගුරුභවතා සහ ප්‍රාථමික සාමාන්‍ය ගුරුභවතුන් විසින් මෙම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත (ආබාධ සහිත) ශිෂ්‍යයින් පස්දෙනාගේ සම වගකීම දැරිය යුතු ය. ළමයින්ගේ ශාරීරික වයස සහ බුද්ධි මට්ටම සලකා බලා IEP සැලැස්මක් සකසා 3, 4, 5 ශ්‍රේණිවල අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා තෝරා ගත් කොටස් කෙටි කලෙකින් උගන්වා සම වයස් ළමයින් සමඟ 6 ශ්‍රේණියට ඇතුළත්වීමට කටයුතු සම්පාදනය කළ හැකි ය.

සුවිශේෂී ඉගෙනුම් දුබලතා සහිත සිසුන් සාමාන්‍ය පන්ති කාමරයේ ඉගෙනුම ලබද්දී හඳුනා ගන්නා බැවින්, පළමු ශ්‍රේණියේ සිට 5 වන ශ්‍රේණිවල අන්තර්කරණ අධ්‍යාපනය සඳහා සහය වන ගුරුභවතා විසින් එලෙස හඳුනාගත් සසුන්ට අදාළ විශේෂිත ඉගෙනුම් ක්‍රමවේද මගින් සහය ලබා දිය යුතු ය.

## 11.1 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා / අභිමත නිපුණතා

ප්‍රාථමික අංශයේ I, II, III අදියරවලදී සාමාන්‍ය ළමයෙක් ඒ ඒ අදියරට නියමිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්පත් කරගත යුතු ය. එම අත්‍යවශ්‍ය නිපුණතා ප්‍රවීණතාවයට පත්වීමෙන් තොර ව/ අත්පත් කර ගැනීමකින් තොර ව ඊ ළඟ අදියරකට උසස්විය නො හැකි ය. වඩා දක්ෂ ළමයෙකුට අභිමත නිපුණතා තුළින් ද ප්‍රවීනතා ලබා ගත හැකිය. එතෙකුදු වුව දුබලතා සහිත ළමයින් විශේෂ අධ්‍යාපන තක්සේරුකරණයට ලක් වීමෙන් පසුව කුමන හෝ නිර්දේශයක් ලැබීමෙන් පසුව ඉගෙනුම ලබන්නේ පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුමකට අනුව නම් විකල්ප සන්නිවේදන ක්‍රම, උපකාරක තාක්ෂණය සහ විෂයමාලා අනුවර්තන මඟින් ඉගෙනුම ලබන ශිෂ්‍යයාට සාමාන්‍ය ළමයෙක් අත්පත් කරගන්නා ඉගෙනුම් නිපුණතා ඒ ආකාරයෙන් ම අත්පත් කරගත නො හැකිවනු ඇත. ඔහු නිපුණතා අත්පත් කර ගත යුත්තේ ද පාසල් මට්ටමේ සම්භවන සහ සම්පිණ්ඩිත ඇගයීම් සිදු කිරීම, මාසික පරීක්ෂණ සහ වාර පරීක්ෂණ සිදු කිරීම කළ යුත්තේ ද වෛද්‍ය නිර්දේශ සැලකිල්ලට ගනිමින් සහ පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් කමිටුවේ නිර්දේශ ද, කලාපයීය තක්සේරු කමිටුවේ විභාග පහසුකම් සැලසීමේ නිර්දේශ ද සැලකිල්ලට ගනිමිනි.

## 12.0 අන්තර්කරණ අධ්‍යාපනය

## 12.1 හය ශ්‍රේණියේ දී පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනය

හය ශ්‍රේණියේ දී සම වයස් ළමයින් සමඟ ඉගෙනුමට හැකිවන පරිදි ළමයාගේ ජෛව විද්‍යාත්මක වයස සහ  බුද්ධිමය වයසත් සමඟ ඉදිරි ජීවිතයට විෂයමාලාව ඉගෙනුමට අවශ්‍ය අත්‍යවශ්‍ය නිපුණතා තෝරා ගෙන සැලසුම් කළ කාලය තුළදී සංවර්ධනය කර ශිෂ්‍යයාට හය ශ්‍රේණියේ සිට පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනයක් ලබා දීමට සැලසුම් කළ යුතු ය. ඉහත 9 පරිච්ඡේදයේ දී මෙන් IEP කමිටුවේ දී දෙමාපියන්ගේ පූර්ණ එකඟතාවය ඇතිව IEP සැලැස්මක් කිරීම අත්‍යවශ්‍ය වේ.

සෑම පාසලක ම සිටින විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධානගේ සහය ලබාගෙන අවශ්‍ය පහසුකම් සැපයීමෙන්, වර්ධනීය විකල්ප සන්නිවේදන ක්‍රම භාවිතයෙන් (Augmantative Aulternative Communication - AAC), විකල්ප උපකාරක තාක්ෂණය (Augmantative Assetive Technology - AAT) භාවිතයෙන් ළමයා සංවර්ධනය සඳහා කටයුතු කළ යුතු ය.

## 12.2 හය ශ්‍රේණියේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා

හය ශ්‍රේණියේ සිට කනිෂ්ට ද්විතියික අධ්‍යාපනයේ අවසන් ශ්‍රේණිය දක්වා IEP අවශ්‍ය වේ නම් විශේෂ අධ්‍යාපන ගුරුවරයාගේ ද සහය ඇතිව සාමාන්‍ය විෂය මාලාව ක්‍රියාත්මක කරන ගුරුභවතුන් විසින් එක් ව හෝ විශේෂ අධ්‍යාපන ඒකකයක් නොමැති පාසල්වල විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන සමඟ එක්ව IEP සැලැස්ම සකස් කළ යුතු ය. IEP සැලැස්මේ දිගුකාලීන අරමුණ විය යුත්තේ හය වෙනි ශ්‍රේණියේ සිට පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනය ලබමින් කණිෂ්ට, ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම ය. සාමාන්‍ය ළමයින් සම්පූර්ණ කළ යුතු මොඩියුල ගුරුභවතෙකුගේ සහය ලබමින් සම්පූර්ණ කිරීමත්, ළමයාව උපරිම විභව්‍යතාවයට පත් කිරීමත්, ළමයින්ගේ විවිධත්වය අනුව අවශ්‍ය මොඩියුල ප්‍රමාණය තීරණය කර ඉගෙනුම් ඵල අත්කර දීමටත් මෙහි දී සැලසුම් කළ යුතු ය. මෙහි දී කලාපයීය තක්සේරුකරණ කමිටුවේ සම්පත් පුද්ගල සහය ලබා ගත හැකි ය.

ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධියේ සිට අ.පො.ස.(සාමාන්‍ය පෙළ) දක්වා IEP අවශ්‍ය වේ නම් විශේෂ අධ්‍යාපන ගුරුවරයාගේ ද සහය ඇතිව සාමාන්‍ය විෂය මාලාව ක්‍රියාත්මක කරන ගුරුභවතුන් විසින් එක් ව හෝ විශේෂ අධ්‍යාපන ඒකකයක් නොමැති පාසල්වල විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංශ ප්‍රධාන සමඟ එක්ව IEP සැලැස්ම සකස් කළ යුතු ය. කණිෂ්ඨ, ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයින් පූර්ණ අන්තර්කරණ අධ්‍යාපනය ලබමින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත් කිරීම ය.

## 12.3 අ.පො.ස. (උසස් පෙළ) / තෘතියික අධ්‍යාපනය / උසස් අධ්‍යාපනය

9 ශ්‍රේණිය සමත් වන බුද්ධිමය දුබලතා සහිත සිසුන්ගේ දිගුකාලීන අරමුණ විය යුත්තේ NVQ 1 සම්පූර්ණ කිරීමයි. එසේම 11 ශ්‍රේණිය සම්පූර්ණ කළ බුද්ධිමය දුබලතා සහිත සිසුන්ට NVQ 2 සම්පූර්ණ කිරීම ද උසස් පෙළ සම්පූර්ණ කළ බුද්ධිමය දුබලතා සහිත සිසුන්ට NVQ 3 ද ලබා දීම සිදු කළ යුතුය.එම NVQ සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යෝදා විශේෂ හා අන්තර්කරණය පිළිබඳ ජාතික ආයතනය මගින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) අසමත්ව 13 වසරක අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකුගේ දිගු කාලීන අරමුණ විය යුත්තේ NVQ 4 සම්පූර්ණ කර ගැනීම සහ අ.පො.ස.(උසස් පෙළ) සමත්කර ගැනීම තුළින් වෘත්තියකට ඇතුළත් වීමයි. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත්ව අ.පො.ස.(උසස් පෙළ) සාමාන්‍ය විෂය ධාරාව හදාරණ ශිෂ්‍යයෙකුගේ අධ්‍යාපන වැඩපිළිවෙළෙහි දිගුකාලීන අරමුණ විය යුත්තේ අ.පො.ස.(උසස් පෙළ) සමත්ව උසස් අධ්‍යාපනය ලැබීමට සූදානම් වීම යි. අන්‍යයන් සමඟ එකට එක් වී වෘත්තියක් කිරීමට අවශ්‍ය ජීවන ප්‍රවේශයන් හඳුනාගෙන වෘත්තීය මාර්ගෝපදේශනය තුළින් ශිෂ්‍යයාට ගැළපෙන වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීමට අවස්ථා සම්පාදනයකර දීමයි. මෙහි දී විශේෂ අධ්‍යාපන ඒකකයක් ඇති පාසල්වල නම් විශේෂ අධ්‍යාපන ඒකකයේ ගුරුවරයාගේ සහය ඇතිව එම කටයුතු කළ යුතු ය.

අ.පො.ස.(උසස් පෙළ) පන්තිවල දී ද ඉහත පරිදි IEP සඳහා දිගුකාලීන අරමුණ විය යුත්තේ අ.පො.ස.(උසස් පෙළ) සමත්ව විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමයි. එසේ ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයින් සඳහා තෘතියික අධ්‍යාපන වෘත්තීය පාඨමාලාවක් හෝ උසස් අධ්‍යාපන අවස්ථා හිමි කර ගෙන සම්පූර්ණ කිරීම හෝ නොවිධිමත් අධ්‍යාපන හෝ වෙනත් පාඨමාලාවක් හදාරා වෘත්තියක් කිරීමට හෝ ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමට බලවන්ත කළ යුතු ය.

## 13.0 පුද්ගලබද්ධ පාඩම් සැලසුම (Individual Lesson Plan - ILP) සහ බහුතල පාඩම් සැලසුම (Multi-Level Lesson Plan-MLLP)

සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයා (Mobile/Field Teacher) IEP කමිටුව සමඟ එක් වී ඒ ඒ ළමයාගේ IEP අනුව වෙන වෙන ම පුද්ගලබද්ධ පාඩම් සැලසුම (ILP) බැගින් සකසා ඉගැන්විය යුතු ය. විශේෂ අධ්‍යාපන ඒකකවල/රජයේ විශේෂ පාසල්වල/උපකෘත විශේෂ පාසල්වල එක් පන්තියක ශිෂ්‍යයින් කිහිපදෙනෙකු සිටින නිසා ඔවුන්ගේ IEP සියල්ලට ගැළපෙන පරිදි බහුතල පාඩම් සැලසුම (MLLP) අනුව ඉගැන්විය යුතු ය.

### 13.1 පුද්ගලබද්ධ පාඩම් සැලසුම (Individual Lesson Plan - ILP)

සංචාරක/ක්ෂේත්‍ර ගුරුවරයා (Mobile/Field Teacher) IEP කමිටුව සමඟ එක් වී ඒ ඒ ළමයාගේ IEP අනුව වෙන වෙන ම පුද්ගලබද්ධ පාඩම් සැලසුම (ILP) සැලසුම බැගින් සකසමින් නිපුණතා මට්ටම් සහ නිපුණතාවලින් ප්‍රවීණතාවට ගෙන එමින් IEP ඉලක්ක කරා ශිෂ්‍යයා සංවර්ධනය කළ යුතු ය. මේ සඳහා "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I"හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවේ සඳහන් ළඟා නොවූ නිපුණතා මට්ටම් සහ නිපුණතාවලට ළමයාව සංවර්ධනය කිරීම සැලසුම් කළ යුතු ය. එනිසා IEP කෙටිකාලීන ඉලක්ක ලෙස "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I"හි අදාළ වසර තුළදී ඉගැන්වීමට බලාපොරොත්තු වන ප්‍රවීණතාවට පත් කළ යුතු නිපුණතා අංක ලිවිය යුතු ය. (ළඟා වූ නිපුණතා මට්ටම් සහ නිපුණතා, ගුරු උපදේශක තහවුරු කර තිබිය යුතු ය)

## 13.2 බහුතල පාඩම් සැලසුම (Multi-Level Lesson Plan-MLLP)

"අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි සඳහන් ළමයාගේ තක්සේරු කිරීමේ තොරතුරු පත්‍රිකාවේ සඳහන් නිපුණතා මට්ටම් හැර ඉතිරි නිපුණතා මට්ටම් ඇතුළත් ව ඇති ප්‍රධාන නිපුණතාවලට අදාළ වසර තුළ එම අංශ 08න් ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන විෂයය පරාසය ශිෂ්‍යයාට උගන්වන ගුරුභවතා විසින් හඳුනා ගත යුතු ය. මෙලෙසින් ගුරුභවතාගේ වගකීමට භාර වෙන ශිෂ්‍යයින් සියලු දෙනා පිළිබඳ ව ම හඳුනා ගත යුතු ය. එක් එක් ශිෂ්‍යයාගේ සිසු හැකියාවට අනුව ඉගෙනුම් තල විවිධ ය. එම ඉගෙනුම් තල 05ක් ඒකාබද්ධ කර එක් පාඩම් සැලසුමක් (Lesson Plan - LP) සකස් කළ යුතු ය. මෙම පාඩම් සැලසුම (LP) බහුතල පාඩම් සැලසුමකි (MLLP). මෙලෙසින් පාඩම් සැලසුම් මඟින් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි නිපුණතා කරා ශිෂ්‍යයා ප්‍රවීණතාවට පත් කළ යුතු ය. එනිසා IEP කෙටිකාලීන ඉලක්ක ලෙස "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා... විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය II"හි අදාළ වසර තුළදී ඉගැන්වීමට බලාපොරොත්තු වන පාඩම් අංක ලිවිය යුතු ය (ළඟා වූ නිපුණතා මට්ටම් සහ නිපුණතා ගුරු උපදේශක තහවුරු කර තිබිය යුතු ය).

විශේෂ අධ්‍යාපන ඒකකයේ හෝ උපකෘත විශේෂ පාසලේ පන්ති කාමරය තුළ ශිෂ්‍යයින් 05දෙනෙකු සිටී නම් සහ ඔවුන්ගේ මට්ටම් 05ක් ඇත්නම් පාඩම් මාලාව අතරතුර දී සහ අවසානයේ දී අඛණ්ඩව සිදුවන (සන්තතික) ඇගයීම්වලදී ඒ ඒ ළමයාගේ ඉගෙනුම් තලය/මට්ටම අනුව පරීක්ෂා කිරීමට, ඇගයීම් කිරීමට, තක්සේරු කිරීමට සුදුසු ක්‍රමවේද සැලසුම් කළ යුතු ය. එම සැලසුම IEP කමිටුවට ඉදිරිපත් කළ යුතු ය. එම කමිටුවේ දී ඒ ඒ ළමයාගේ සංවර්ධනය විය යුතු අංශ ගුරුවරයා ඉටු කළ යුතු කාර්යභාරය, ගුරු උපදේශකගේ කාර්යභාරය, සහය චිකිත්සකවරුන් සහභාගි වන්නේ නම් ඔවුන්ගේ කාර්යභාරය සහ ප්‍රවීණතාවයට පත්වන ශිෂ්‍යයින්ගේ එම ප්‍රවීණතාවයට පත් වූ ඉගෙනුම් ඵලය සම්බන්ධයෙන් දෙමව්පියන්/භාරකරු අනුගමනය කළ යුතු අනාගත ක්‍රියාමාර්ග සාකච්ඡා කර අවබෝධ කර දිය යුතු ය. එහි දී සිසුන් ප්‍රාථමික අධ්‍යාපනයට යොමු කිරීම පහත පරිදි කළ යුතු ය.

## 14.0 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයා වෙනුවෙන් ඉගෙනුම් ඉගැන්වීම් සහ සම්භවන සහ සමපිණ්ඩිත ඇගයීම් ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි අනුවර්තන ක්‍රම

IEP සැලැස්මේ ඇති දිගු කාලීන අරමුණුවලට ළඟාවීම සඳහා සකස් කරනු ලබන පුද්ගල බද්ධ පාඩම් සැලසුම් (ILP) සහ බහුතල පාඩම් සැලසුම් (MLLP) සකස් කිරීමේ දී පාඩමට සුවිශේෂ වූ අරමුණු ලිවීමේ දී පහත දැක්වෙන අනුවර්තන ක්‍රම භාවිත කිරීමට කටයුතු කළ යුතු ය.

1. බුද්ධිමය දුබලතාවය ඇති ශිෂ්‍යයින් එකවර සංකල්ප එකකට වඩා ඉගෙනුමට අපහසු ය. එ නිසා පින්තූර භාවිතයේ දී පින්තූරය සංකල්ප එකකට හෝ දෙකකට සීමා කිරීම සහ ලුමිනස් වර්ණ යොදා ආකර්ෂණය ඇති කිරීම
2. විශාලනය කරන අකුරු පොත් මඟින් කියවීමට අපහසු යැයි ප්‍රජා ළමා රෝග විශේෂඥ වෛද්‍ය නිර්දේශ ඇති ශිෂ්‍යයින්ට ටැබ් පරිගණකයක් භාවිත කිරීම
3. ටැබ් පර්ගණකයෙන් මූලික අකුරු, සරල වචන හඳුනා ගත් ශිෂ්‍යයෙකුට වෙහෙසකර නොවීම සඳහා ශ්‍රවණ පොත් මඟින් ඉගෙනුමට අවස්ථාව ලබා දීම
4. ඔටිසම්, ඩවුන්ස් සින්ඩ්‍රෝම් වැනි ශිෂ්‍යයින්ට දත් මැදීම, මුහුණ සේදීම වැනි දෛනික ක්‍රියාකාරකම් සඳහා ඇති පියවරෙන් පියවර ඡායාරූප මඟින් හෝ පින්තූර මඟින් පෙන්වා පුහුණු කිරීම
5. ශිෂ්‍යයා නිම කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ප්‍රමාණය අඩු කිරීම / සරල කිරීම
6. කාර්යයන් නිම කිරීමට හෝ ඇගයීමට තිබෙන කාල රාමු අඩු කිරීම හෝ කාල රාමු වෙනස් කිරීම

7. අතිරේක උපදෙස් ලබා දීම හෝ සහය වැඩි කිරීම
8. විශාලනය කරන ලද පොත් සැපයීම, ඉගෙනුම් ආධාරක සැපයීම හෝ ඉගෙනුම් ක්‍රමවල වෙනස්කම් ඇති කිරීම
9. කාර්යයේ තිබෙන අපහසුතාවය අනුව අනුවර්තනය කිරීම හෝ අතිරේක උපදෙස් ලබා දීම හෝ උපකරණ ලබා දීම
10. වාචිකව හෝ සංඥා, බ්‍රේල්, බ්ලිස් ආදී විකල්ප සන්නිවේදන ක්‍රම භාවිතයෙන් ඉගැන්වීම සහ ඇගයීම
11. අඛණ්ඩව සහභාගිවිය නොහැකි ළමයින්ට තිතෙන් තිත ක්‍රමය (Dot to Dot Method) මඟින් අවධානය යොමු කළ හැකි කාලය වැඩි කිරීමට පුහුණු කිරීම
12. එක ම පාඩමක දී වුව ද ශිෂ්‍ය විවිධත්වය අනුව අපේක්ෂිත ඉගෙනුම් ඵලවල වෙනස්කම් ඇති කිරීම
13. ආත්මෝපාකාරක කුසලතා පුහුණුව සහ ඇස, අත සමායෝජනය සංවර්ධනය කිරීම
14. පැවරුම්වල කාලය දිගු කිරීම
15. කාලය සීමාවකින් තොරව ඇගයීම් සිදු කිරීම ශිෂ්‍යයා තුළ චර්යාත්මක වෙනස්කමක් ඇති කිරීම සඳහා සිදුකරන සම්භවන හෝ සම්පිණ්ඩිත ඇගයීම් කාලය දිගුකර වර්ධනය සහ ප්‍රාප්තිය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය
16. ශිෂ්‍යයාගේ හැකියාව සහ කුසලතාවය අනුව සුදුසු ක්ෂේත්‍රවලට යොමු කිරීම
17. ඔහුගේ විවිධත්වයට අනුව ළඟාකර ගත හැකි ඉලක්කයන් හඳුනාගෙන ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදීම
18. විද්‍යුත් නොවන විකල්ප ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
19. වර්ධනීය සහ විකල්ප සන්නිවේදනය (AAC), උපකාරක තාක්ෂණය (AT) සහ විකල්ප උපකාරක තාක්ෂණය (AAT) භාවිත කිරීම
20. ආකර්ශණීය විෂය කරුණු ඇතුළත් විකල්ප පොත් ලබා දීම
21. ඉතා ඉහළ කැමැත්ත ඇතිවන ආකාරයේ කියවීම් ද්‍රව්‍ය/උපකරණ ලබා දීම
22. මුද්‍රිත සහ වාචික දෙවර්ගයේම උපදෙස් ලබා දීම
23. ඇගයීම් ක්‍රමය බහුවරණ ක්‍රමය වෙනුවට දෙවරණ ක්‍රමය යෙදීම (උදා:- ඔව්/නැත, හරි/වැරදි)
24. පාඩමක සමස්තය පිළිබඳ ප්‍රශ්න නොවිමසා එහි කුඩා කොටස් ගෙන ඒවා අවබෝධ වන ලෙස කෙටි පිළිතුරු ලබා ගත හැකි ආකාරයේ ප්‍රශ්න ලබා දීම (උදා:- ඔව්/නැත, හරි/වැරදි)
25. ඇගයීමට ලක්කරන ප්‍රශ්න සංඛ්‍යාව අඩු කිරීම/තේරුම් ගැනීමට හැකි ලෙස සරල කිරීම

## 15.0 පන්ති කාමර අනුවර්තන

| | පහසුකම් | නවීකරණය |
|---|---|---|
| 1. | ශිෂ්‍යයින්ගේ පුටු, ඉගෙනුම් ආධාරක පුවරුව (කළු ලෑල්ල) හෝ ගුරුවරයාට ආසන්නයේ තැබීම | ගුරුවරයා විසින් කළු ලෑල්ලේ සටහනේ පිටපත් ශිෂ්‍යයාට ලබා දීම |
| 2. | පිළිතුරු දීමේ කාලය වැඩි කිරීම | කෙටි සටහන් ලබාදීම සමඟ ප්‍රශ්නය ලබා දීමෙන් පිළිතුරු දීමට අතිරේක සහය ලබා දීම |
| 3. | නැවත නැවත ප්‍රතිපෝෂණය දීම | ඇගයීමේ ප්‍රමාණය අඩු කිරීම, විකල්ප පැවරුම් දීම සහ නැවත නැවත ප්‍රතිපෝෂණය දීම |
| 4. | ළමයාගෙන් ප්‍රතිචාර ලැබිය යුතු යැයි සිතන ආකාරය වෙනස්කර වාචික පරීක්ෂණ/වාචික කෙටි පිළිතුරු ලබාදීම | ළමයාගෙන් ප්‍රතිචාර ලැබිය යුතු යැයි සිතන ආකාරය වෙනස් කර එම විෂයය සීමාව ශක්තිමත්ව අවබෝධ කර ගත හැකි ආකාරයේ කුඩා පැවරුම් දීම සහ ඒ තුළින් වාචික පරීක්ෂණ/වාචික කෙටි පිළිතුරු ලබා ගැනීම හෝ වෙනත් විකල්ප සන්නිවේදන ක්‍රමවලින් පිළිතුරු ලබා ගැනීම |
| 5. | ගුරුවරයෙකු හෝ වෙනත් අයෙකු විසින් ශාරීරිකව හෝ අතිරේකව සරල උපදෙස් දීම | නවීකරණය කරන ලද සරල පරීක්ෂණය, සමහර ළමයින් සඳහා සන්නිවේදන පොත භාවිතය |
| 6. | සම්භවන/සම්පිණ්ඩිත ඇගයීම් | පහසු, සරල, විකල්ප ඇගයීම් ආකෘති භාවිතය |
| 7. | විකල්ප සහය තාක්ෂණය භාවිතය | විවිධත්වය අනුව නවීකරණය කරන ලද ශ්‍රේණි කිරීම |
| 8. | සහයකයෙකු සමඟ ඉන්දවීම තුළින් ඔහුගේ සහයෙන් ඉලක්ක අපේක්ෂාවට ගමන් කිරීම | නවීකරණය කරන ලද අපේක්ෂාවන් |
| 9. | කාල වේලාවක් සහිත පරීක්ෂණ සඳහා කාලය ඇගයීම සම්පූර්ණ වන තෙක් ලබා දීම | ඊට ගැළපෙන නවීකරණය කරන ලද පරීක්ෂණ/ඇගයීම් ක්‍රම |
| 10. | ඒ ඒ ළමයාගේ හඳුනා ගන්නා ලද ඉගෙනුම් ක්‍රමවේදයට අනුකූලව ප්‍රයෝගිකව ක්‍රියාකාරකම් දීම | ශ්‍රවණය කරන ලෙස පටිගත කරන ලද පාඩම් දීම, ශ්‍රව්‍ය,දෘෂ්‍ය ආධාර භාවිතය, විශාලනය කරන ලද පොත් ලබා දීම වැනි ක්‍රම මඟින් විවිධත්වයට ආමන්ත්‍රණය කිරීම |
| 11. | ක්‍රියාකාරකම් සඳහා ආරම්භයේ සිට අවසානය දක්වා සම්පූර්ණ ක්‍රියාකාරකම්හි යෙදීමට අපහසු ශිෂ්‍යයෙකුට කුමන හෝ අවස්ථාවකින් සහභාගිවීමට අවස්ථාව ලබාදීම | මෘදුකාංගයක් අධාරයෙන්, පරිගණක භාවිතයෙන් ක්‍රියාකාරකමෙහි යෙදීමට අවස්ථාව ලබාදීම |

ඉහත දක්වා ඇති පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ ඇතුළත් කළ යුතු පහසුකම් නවීකරණය පිළිබඳ දළ මඟ පෙන්වීමක් පමණි. මේ පිළිබඳ වැඩිදුර පුහුණුවක් ගුරුභවතුන්ට ලබා දෙනු ලැබේ. මීට අමතරව පන්ති කාමරය නවීකරණය කිරීම, ඉගැන්වීමේ යෝජනා, උපදෙස්, අත් අකුරු, ගණිතය, හැසිරීම, ශිෂ්‍යයින්ගේ දුෂ්කරතා හඳුනා ගැනීම, ඒ ඒ වර්ගවලට අනුව හඳුනා ගැනීමේ දුෂ්කරතා අමන්ත්‍රණය කිරීම, ශ්‍රේණිගත කිරීම අනුවර්තනය, නිවසේ දී පැවරුම් ක්‍රියාත්මක කිරීමට අනුවර්තන ක්‍රම හඳුන්වා දීම, පන්ති කාමරයේ දී සාමාන්‍ය පැවරුම් ලබාදීම සහ ක්‍රියාකාරකම් පැවරීම, පැවරුම් ශ්‍රේණි කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂා සහ ශ්‍රේණි කිරීම, විකල්ප ඇගයීම් ක්‍රම ලබා දීම පිළිබඳ පුහුණුව ඉදිරියේ දී සිදු කරනු ලැබේ.

**16.0 කලාප මට්ටමේ විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශය මත දුබලතාවය පදනම් කරගෙන සාමාන්‍ය පාසලක පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කර අන්තර්කරණ අධ්‍යාපන පහසුකම් ලබා දීම**

අධ්‍යාපන තක්සේරුකරණයෙන් 75 - 100 දක්වා ලකුණු ලබා ගන්නා ළමයින් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020.12.03 දිනැති 37/2020 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය අනුව පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශ පරිදි මෙම ළමයින්ගේ නම් ඇතුළත් ලේඛන 02ක් සකස් කළ යුතු ය.

**16.1 ජාතික පාසල්වල පළමුවෙනි ශ්‍රේණියට අබාධිතභාවය පදනම් කරගෙන 3%ක් ඇතුළත් කිරීම**

ජාතික පාසල්වලට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන ළමයින්ගේ නාම ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාවට සෑම වසරක ම මාර්තු මස 31වන දිනට පෙර පිටපත් 03කින් එවිය යුතු ය. නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාවේ නිර්දේශයෙන් ජාතික පාසල් ශාඛාව විසින් අනුමත කිරීමෙන් පසුව කලාපයට අනුමත ලැයිස්තුවක් එවනු ලැබේ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන කලාපයේ සියලු ම ජාතික පාසල්වලට එහි පිටපත බැගින් ලබා දිය යුතු ය. 2016.04.20 දිනැති සහ අංක 1963/30 දරණ අනිවාර්ය අධ්‍යාපන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ප්‍රාථමික අංශයක් ඇති පාසල්වල පෝෂිත ප්‍රදේශයේ පදිංචි එම ලැයිස්තුවේ නම් සඳහන් සියලු ළමයින් කුමන හෝ ගණයක් යටතේ සුදුසුකම් ලැබුවහොත් දුබලතාවය පදනම් කරගෙන කිනම් හෝ ගණයකින් අදාළ ජාතික පාසලට ඇතුළත් කළ යුතු ය.

**16.2 පළාත් පාසල්වල පළමුවෙනි ශ්‍රේණියට අබාධිතභාවය පදනම් කරගෙන 3%ක් ඇතුළත් කිරීම**

පළාත් පාසල්වලට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන ළමයින්ගේ නාම ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් සහ අනුමැතියෙන් පසුව පිටපත බැගින් පළාතට අයත් සියලු ම ප්‍රාථමික පාසල්වලට ලබා දිය යුතු අතර දුබලතාවය පදනම් කරගෙන සෑම පාසලකට ළමුන් ඇතුළත් කිරීමේ කුමන හෝ ගණයකින් පළමුවෙනි ශ්‍රේණියට ඇතුළත් කළ යුතු ය.

**16.3 ආබාධිතභාවය පදනම් කරගෙන පළමුවෙනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම**

ජාතික පාසලක් සම්බන්ධයෙන් මෙම වරප්‍රසාදය ලබා ගැනීමට ඉහත 14.1 ලැයිස්තුවට අදාළ ළමයාගේ නම ඇතුළත් වී තිබිය යුතු ය. පළාත් පාසලක් සම්බන්ධයෙන් මෙම වරප්‍රසාදය ලබා ගැනීමට ඉහත 14.2 ලැයිස්තුවට අදාළ ළමයාගේ නම ඇතුළත් වී තිබිය යුතු ය. ඊට අමතරව පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සඳහා ඒ ඒ වසරේ දී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පළමුවන වසරට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ නිකුත් කරන චක්‍රලේඛයේ කිනම් හෝ ගණ යටතේ ආබාධිතභාවය පදනම් කරගෙන ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා මණ්ඩලය අවසාන ලැයිස්තු සකස් කිරීමේ දී ඉහත 14.1 සහ 14.2 ලැයිස්තුවල නම් සඳහන් වේ නම් එම ඉල්ලුම්කරුවන්ගෙන් 3%ක් ඇතුළත් කර තිබිය යුතු ය.

**16.4 විශේෂ අධ්‍යාපන ඒකකයේ ශිෂ්‍යයින් ඒකීයකරණය කිරීමේ දී පන්තිවල ශිෂ්‍ය සීමා**

කලාප මට්ටමේ විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවේ නිර්දේශය මත විශේෂ අධ්‍යාපන ඒකකයක ඉගෙනුම ලබන ශිෂ්‍යයින් පළමුවෙනි ශ්‍රේණියට හෝ වෙනත් ශ්‍රේණියකට ඒකීයකරණය කිරීමේ දී සහ කිනම් හෝ ශ්‍රේණියකට ඒකීයකරණය කිරීමේ දී ශිෂ්‍යයින්ගේ නම් විශේෂ අධ්‍යාපන ඒකකයේ නාම ලේඛනයෙන් ඉවත් කර අදාළ පන්තියේ නාම ලේඛනයට ඇතුළත් කළ යුතු ය. එලෙස ඒකීයකරණය කළ ශිෂ්‍යයින් ව නැවත විශේෂ අධ්‍යාපන ඒකකයට ඇතුළත් කිරීම කළ නො හැක්කේ ය. ශිෂ්‍යයින් පන්තිවලට ඒකීයකරණය කිරීමේ දී ඔවුන් පාසලේ ම ශිෂ්‍යයින් වන බැවින් අදාළ පන්තියේ සාමාන්‍ය ළමයින් සඳහා වන චක්‍රලේඛවල සඳහන් පන්තිවල ශිෂ්‍ය සීමා නොසලකා කටයුතු කළ යුතු ය.

**17.0 පාසල් මට්ටමේ සහ ජාතික මට්ටමේ විභාග පහසුකම් ලබා දීම/සම්භවන සහ සම්පිණ්ඩිත ඇගයීම් සිදු කිරීම.**

පාසල් මට්ටමේ සම්භවන සහ සම්පිණ්ඩිත ඇගයීම් සිදු කිරීම, මාසික පරීක්ෂණ සහ වාර පරීක්ෂණ සිදු කිරීම කළ යුත්තේ වෛද්‍ය නිර්දේශ සැලකිල්ලට ගනිමින් සහ පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් කමිටුවේ නිර්දේශ ද, කලාපයීය තක්සේරු කමිටුවේ විභාග පහසුකම් සැලසීමේ නිර්දේශ ද සැලකිල්ලට ගනිමිනි. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත/දුබලතා සහිත ශිෂ්‍යයින් කොටස් 02කට බෙදිය යුතු ය. මේ පිළිබඳව කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව ඒ ඒ ශිෂ්‍යයා සම්බන්ධයෙන් පහත සඳහන් ගණ 02ට අයත් වන ශිෂ්‍යයින් කාලානුරූපව හඳුනාගෙන යාවත්කාලීනව ලැයිස්තු පවත්වාගෙන යා යුතු ය.

1. දුබලතා සහිත එහෙත් සම්භවන හෝ සම්පිණ්ඩිත විභාග/ඇගයීම් සඳහා විශේෂ පහසුකම් අවශ්‍ය නොවන ශිෂ්‍යයින්
2. දුබලතා සහිත සම්භවන හෝ සම්පිණ්ඩිත විභාග/ඇගයීම් සඳහා විශේෂ පහසුකම් අවශ්‍ය වන ශිෂ්‍යයින් වශයෙනි.

මෙම නිර්දේශ පිළිබඳව ශිෂ්‍යයාගේ වර්ධනීය ශිෂ්‍ය වාර්තා පොතෙහි (ASRB) සහ විශේෂ අධ්‍යාපන ඒකකයේ හෝ පාසලේ ඇති ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ සටහන් කළ යුතු ය. (ගුරුවරයා සහ දෙමව්පියන්ගේ සටහන් දෙකම පරීක්ෂා කර තීරණ ගැනීම සඳහා) මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රියාවලිය සඳහා විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් පිළිබඳව අමාත්‍යාංශයේ වර්ග 14ක් යටතට ගැනෙන ශිෂ්‍යයින් සඳහා පාසල් මට්ටමේ සහ ජාතික මට්ටමේ විභාග පහසුකම් ලබා දීමේ දී පහත සඳහන් අංශ 05ට අයත් ශිෂ්‍යයින් සඳහා වෙන වෙන ම පහසුකම් ලබා දිය යුතු ය.

1. පළමුවෙනි අංශය කොටස් 02කි.
   i. පූර්ණ අන්ධ (බ්‍රේල් මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ඇති) - Blindness
   ii. දෘෂ්ටි ඌනතා (බ්‍රේල් මාධ්‍යයෙන් අධ්‍යාපනය නොලබන) - Visual Impairment

2. දෙවෙනි අංශය කොටස් 02කි.
   i. පූර්ණ බිහිරි (සංඥා භාෂාවෙන් අධ්‍යාපනය ලබා ඇති) - Deafness
   ii. ශ්‍රවණ ඌනතා (සංඥා භාෂාවෙන් අධ්‍යාපනය ලබා නැති) - Hearing Impairment

3. තෙවෙනි අංශය
   i. කායික දුබලතා සහිත ශිෂ්‍යයින්

4. සිව්වෙනි අංශය
   i. ඔටිසම් රේඛීය පරාසය - Autism Spectrum Disorder
   ii. බුද්ධිමය දුබලතාව - Intellectual Disability
   iii. සමස්ත සංවර්ධන ප්‍රමාදය - Global Development Delay
   iv. ඔටිසම් ප්‍රෙක්ෂාවලි අක්‍රමවත් බව - Autism Spectrum Disorder
   v. ඩවුන්ගේ සහලක්ෂණය/ඩවුන්ස් සින්ඩ්‍රෝමය - Down Syndrome
   vi. රෙට් සහලක්ෂණය/රෙට් සින්ඩ්‍රෝමය - Ratty Syndrome
   vii. ෆැගයිල් x සහලක්ෂණය/සින්ඩ්‍රෝමය - Fragile X Syndrome
   viii. ළමාරෝග විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ වූ වෙනත් සහ ලක්ෂණයන්/සින්ඩ්‍රොමයන් - Any Other Syndrome as Recommended by pediatrician having a disability
   ix. මස්තිෂ්ක ආඝාතය - Cerebral Palsy
   x. මස්තිෂ්ක දෘෂ්ටි ඌනතාවය - Cortico - visual impairment
   xi. කථන හා භාෂණ දුබලතාවය - Speech and Language Disorder

xii. මොළයට සිදු වූ සහජ නොවූ හානි - Acquired Brain Injury
xiii. ඌන අවධානය සහිත අධි ක්‍රියාකාරී බව - Attention Deficit Hyperactivity Disorder
xiv. චිත්තවේගී කැළඹීම- Emotional Disturbance
xv. වර්ධන ප්‍රතිගමනය - Development Regression
xvi. ප්‍රජානන හෝ කථන අපහසුතා සහිත වර්ධන ප්‍රමාද - Development delay with cognitive or speech involvement
xvii. දෙබුන් කශේරුව නිසා ඇතිවන ස්නායු නෙරීම නැවත යථා තත්ත්වයට පත් කිරීම - Meningo - myelocoel repaired
xviii. අපස්මාර සින්ඩ්‍රෝමය/අපස්මාර සහ ලක්ෂණය - Seizure disorder/Epileptic Syndrome
xix. අනෙකුත් ව්‍යුහාත්මක මොළයේ ආබාධ උදා:- හයිඩ්‍රොසෙෆලස් - Other Structure Brain Disorders Eg:- Hydrocephalus
xx. මයෝපති/ස්නායු අබාධ සහිත ළමයින් - Children with myopathy
xxi. බහුවිධ දුබලතා - Multiple Disabilities

සිව්වෙනි වර්ගයේ ශිෂ්‍යයින්ට ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කළ යුත්තේ ඒ ඒ වර්ගය සහ එම වර්ගය තුළ සුළු, මධ්‍යම සහ උග්‍ර මට්ටම අනුව ය.

5. පස්වෙනි අංශය (සුවිශේෂී ඉගෙනුම් දුබලතා - Specific Learning Disability)

i. කියවීමේ දුබලතා - Dyslexia
ii. ලිවීමේ දුබලතා - Dysgraphia
iii. ගණිතමය දුබලතා - Dyscalculia
iv. චලනය සහ සම්බන්ධීකරණයේ ගැටලු - Dyspraxia
v. සිහිපත් කිරීමේ දුබලතා -Dysnomia
vi. සවන්දීමේ ක්‍රියාවලියේ සිදුවන දුබලතා - Auditory Processing disorder
